ජනවාරි 2018

# පෙර දැක්ම 2018

## 2018 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති

ශ්‍රී ලංකා මහ බැංකුව

# පෙර දැක්ම:
# 2018 සහ ඉදිරිය සඳහා මුදල් සහ
# මූල්‍ය අංශ ප්‍රතිපත්ති


**ඉදිරිපත් කිරීම**

**ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි**

**අධිපති**

**ශ්‍රී ලංකා මහ බැංකුව**


*2018 ජනවාරි 03*

# 1. හැඳින්වීම

ගරු සම්භාවනීය අමුත්තනි, මුදල් මණ්ඩල සාමාජිකයිනි, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිතුමනි, නියෝජ්‍ය අධිපතිවරුන් ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරී මහත්ම මහත්මියනි, විශේෂ ආරාධිත අමුත්තනි, නෝනාවරුනි, මහත්වරුනි.

පළමුවෙන්ම, මෙම වසරේ ප්‍රතිපත්ති පෙර දැක්ම ඉදිරිපත් කිරීමේ අවස්ථාවට සපැමිණි ඔබ සියලු දෙනා සාදරයෙන් පිළිගනිමි.

2007 වසරේ දී ආරම්භ කරන ලද සම්ප්‍රදාය එලෙසම පවත්වාගෙන යමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පෙර දැක්මෙහි 11 වන ප්‍රකාශය අද දින මෙලෙස ඔබ වෙත ඉතා සතුටින් ඉදිරිපත් කරන්නෙමු. අපගේ අනාගත ප්‍රතිපත්ති දිශානතිය සහ ක්‍රියාකාරකම් ඔබ සමඟ බෙදා ගැනීම තුළින් ඔබගේ ව්‍යාපාරවල ඉදිරි ගමන වඩා නිශ්චිතව සැලසුම් කර ගැනීමට හැකිවනු ඇතැයි අපගේ විශ්වාසයයි. මෙම පෙර දැක්ම මගින් අපගේ ප්‍රතිපත්තිවල විනිවිදභාවය සහ පැහැදිලිභාවය වැඩිදියුණු කෙරෙනු ඇතැයි මා බලාපොරොත්තු වන අතර, එය ඔබගේ ව්‍යාපාර ඉලක්කයන් වඩාත් ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීමට උපකාරී වනු ඇත. ඔබගේ ව්‍යාපාර විසින් අත්කර ගනු ලබන සාර්ථක ප්‍රතිඵල අවසානයේ දී ශ්‍රී ලංකා ආර්ථිකයේ සහ මහජනතාවගේ යහපත උදෙසා අප විසින් ගනු ලබන ප්‍රතිපත්ති වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සහාය වනු ඇත.

**2017 වසර අභියෝගාත්මක වසරක් විය.** අයහපත් කාලගුණික තත්ත්වයන් සමස්ත ආර්ථිකය කෙරෙහි බලපෑම් ඇති කළ අතර, පැවති නියං සහ ගංවතුර තත්ත්වයන්ගෙන් කෘෂිකාර්මික කටයුතු සහ කෘෂි නිෂ්පාදිත පදනම් කර ගත් කර්මාන්ත කටයුතුවලට බාධා ඇති විය. අහිතකර කාලගුණික තත්ත්වයන්ගෙන් ඇතිවූ බලපෑම ආර්ථිකයේ අනෙකුත් අංශ කෙරෙහි ද අයහපත් ලෙස බලපෑ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2017 වසරේ ආර්ථික වර්ධනය වසර ආරම්භයේ දී අප පුරෝකථනය කළ මට්ටමට වඩා පහළ සහ අඩු අගයක් ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. සාර්ව ආර්ථික ස්ථායීතාව නැවත ළඟා කර ගැනීමේ අරමුණෙන් ක්‍රියාත්මක කළ මහ බැංකුවේ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මෙන්ම රජය මගින් ක්‍රියාත්මක කිරීමට යෙදුණු සාපේක්ෂ වශයෙන් දැඩි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය රාජ්‍ය සහ පෞද්ගලික ආයෝජන වියදම් කෙරෙහි යම්තාක් දුරට බලපෑ අතර, එය ද ආර්ථික වර්ධනය මන්දගාමී වීමට හේතු විය. උද්ධමන අපේක්ෂාවන් පාලනය කිරීමට අප දරන උත්සාහයන් අභියෝගයට ලක් කරමින් කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම් මගින් දේශීය සැපයුම්වලට ඇති වූ බාධා හේතුවෙන් ආහාර මිල ඉහළ යෑම, වක්‍ර බදු සඳහා වූ සංශෝධන සහ ආනයනික වෙළඳ භාණ්ඩවල මිල ඉහළ යෑම හේතුකොටගෙන පාරිභෝගික

මිල උද්ධමනය ඉහළ ගියේය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කරන්නට යෙදුණු දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හමුවේ වුව ද, මුදල් සමස්තයන්හි වර්ධනය, 2017 වසරේ වැඩි කාලයක දී ඉහළ මට්ටමක පැවතුණු අතර, මුදල් සමස්තයන්හි වර්ධනය වසර අවසානයේ දී අපේක්ෂා කළ මට්ටම දක්වා අඩු විය. ප්‍රධාන අපනයන වෙළඳපොළවල වඩා හිතකර වර්ධන අපේක්ෂාවන් සහ මහ බැංකුවේ නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය හේතුවෙන් ශ්‍රී ලංකාවේ අපනයන සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කළ ද, අයහපත් කාලගුණික තත්ත්වයන් මූලික කොටගෙන ආනයන වියදම ඉහළ යැම හේතුවෙන් වෙළඳ ගිණුමෙහි ශේෂය කෙරෙහි අයහපත් බලපෑම් එල්ල විය. සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පහත වැටීම නිසා ප්‍රේෂණ, විදේශීය ජංගම ගිණුමෙහි වෙළඳ හිඟය පියවීමට දක්වන දායකත්වය අඩු විය. ආදායම් රැස්කිරීමෙහි සුභවාදී වර්ධනයක් රාජ්‍ය මූල්‍ය අංශයෙන් වාර්තා කෙරුණ ද, කාලගුණික බලපෑම් මගින් ඇති කෙරුණු රාජ්‍ය මූල්‍ය වියදම් සහ ඉහළ පොළී ගෙවීම්වල ප්‍රතිඵලයක් ලෙස 2017 වසරේ අයවැය හිඟය අපේක්ෂා කළ මට්ටමට වඩා යම් ප්‍රමාණයකින් ඉහළ යා හැකිය. මෙමගින්, මුදල් ප්‍රතිපත්තිය සහ විනිමය අනුපාතික ප්‍රතිපත්තිය පවත්වාගෙන යැම සංකීර්ණ කෙරෙන අතර, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කෙරෙනු ඇත.

මෙවැනි අභියෝග හමුවේ වුව ද, 2017 වසර මහ බැංකුව සහ රජය අතර මනා සම්බන්ධීකරණයකින් ක්‍රියාත්මක කරනු ලැබූ නොයෙක් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් **ආර්ථිකයේ විවිධ අංශ සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක්** අත්කර ගැනීමට හැකි වූ වසරක් විය. මෙම ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර දක්වමින්, සාර්ව ආර්ථික ස්ථායීතාව යථා තත්ත්වයට පත්වෙමින් තිබෙන අතර, ශ්‍රී ලංකා ආර්ථිකය නිවැරදි දිශානතියකට යොමු වෙමින් පවතී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු වන ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විචක්ෂණශීලී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග රැසක් 2017 වසරේ දී ක්‍රියාත්මක කර ඇත. රටේ සමස්ත සාර්ව ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරීමේ අරමුණින් ප්‍රතිපත්ති රාමු තුනක් ස්ථාපනය කර ඇති අතර, ඒවා ආයතනගත කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත. වඩාත් විචක්ෂණශීලී ලෙස සහ ඉදිරි දැක්මක් සහිතව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට 2020 වසර වන විට නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් (Flexible Inflation Targeting Framework-FIT) ක්‍රියාත්මක කිරීම උදෙසා මහ බැංකුව කටයුතු කරමින් සිටී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපනයන තරගකාරීත්වය ප්‍රවර්ධනය කෙරෙන වඩා නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් ද ක්‍රියාවට නංවා ඇත. අයවැය හිඟය සහ ණය මට්ටම ක්‍රමයෙන් පහළ දැමීමේ අරමුණෙන් ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියකට රජය කැප වී සිටී. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ මුදල් ප්‍රතිපත්තිය නිවැරදි ලෙස ක්‍රියාවට නැංවුවහොත් විනිමය අනුපාතිකවලට ඇතිවන පීඩනය අඩු වනු ඇත. මෙම ප්‍රතිපත්ති රාමු පිළිබඳව සවිස්තරාත්මක ලෙස සාකච්ඡා කිරීමට මම කැමැත්තෙමි.

**මුදල් ප්‍රතිපත්ති රාමුව** ගත් කල, මහ බැංකුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් වෙත යොමු වීම මගින් තිරසාර පදනමකින් උද්ධමනය අඩු මට්ටමක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. රජයෙන් මනා සහයෝගයක් ලැබීම, ඵලදායී ලෙස මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුවට අවශ්‍ය කරන බලතල පැවරීම හා මහ බැංකුවේ විශ්වසනීයත්වය යන මූලධර්ම තුන මත ගොඩනැගුණු නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව ආර්ථික දත්ත මත පදනම් වූ, ඉදිරි දැක්මක් සහිත, විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්ති ක්‍රමවේදයක් වනු ඇත. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ ක්‍රමවේදය වෙත ප්‍රවේශ වීම, රජය විසින් සිය ප්‍රතිපත්ති ප්‍රකාශය වන "2025 දැක්ම" මගින් ද අනුමත කර ඇත. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා රජය හා මහ බැංකුව විසින් සපුරාලිය යුතු නීතිමය, ආයතනිකමය සහ මෙහෙයුම් කටයුතුවල සිදුවිය යුතු වෙනස්වීම් වැනි ඉතා වැදගත් සංධිස්ථාන පෙළ ගැස්වූ පෙර දැක්මක් අප විසින් සකස් කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) ද අපගේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත යොමු වීම පිළිගෙන ඇති අතර, ඒ සඳහා අපගේ නිපුණතාවන් වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දී ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව 2017 වසරේ දී වෙළෙඳපොළ බලවේග මගින් විනිමය අනුපාතික තීරණය කිරීමට ඉඩ හැරීම තුළින් වඩා නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් අනුගමනය කිරීමට යොමු විය. වෙළෙඳපොළ ක්‍රියාකාරීන්ගේ **නම්‍යශීලී විනිමය අනුපාතික** ක්‍රමය පිළිබඳ ධනාත්මක ආකල්ප පිළිබිඹු කරමින් එතැන් වෙළෙඳපොළ ගනුදෙනු යළි සක්‍රිය විය. ශ්‍රී ලංකා මහ බැංකුව ණය බර ඇති නොකරන විදේශ විනිමය සංචිත ප්‍රමාණය ඉහළ නංවා ගැනීම සඳහා දේශීය අන්තර් බැංකු විදේශ විනිමය වෙළෙඳපොළ වෙතින් අඛණ්ඩව විදේශ විනිමය මිලදී ගැනීම සිදු කළේය. මෙම ක්‍රමවේදය ද විනිමය අනුපාතිකය සුමට ලෙස පවත්වාගෙන යාමට දායක විය. විදේශ විනිමය වෙළෙඳපොළ වෙත වූ සැලකිය යුතු ඉහළ ලැබීම් පිළිබිඹු කරමින් 2017 වසරේ සමහර අවස්ථාවන්වල දී විනිමය අනුපාතිකය අධිප්‍රමාණය වීම් ද වාර්තා විය. ශ්‍රී ලංකාවට ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමේ (Extended Fund Facility) හතරවන වාරිකය ද 2017 වසරේ දෙසැම්බර් මාසයේ දී ලැබිණි. ඒ අනුව, මේ දක්වා විස්තීර්ණ ණය පහසුකම යටතේ එ.ජ. ඩොලර් මිලියන 759.9 ක් රට වෙත ලැබී ඇත. මෙමගින් නිර්දේශිත කාර්ය සාධන ඉලක්ක සහ ව්‍යුහාත්මක කඩඉම් යන ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි ඉලක්ක 2017 වසරේ දී ශ්‍රී ලංකාව සතුටුදායක මට්ටමකින් අත්කර ගැනීම තහවුරු කරයි. ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල වර්ධනය පිළිබඳව ධනාත්මක අපේක්ෂාවන්, ශ්‍රී ලංකා මහ බැංකුව නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් පවත්වාගෙන යෑම, හිතකර විදේශ වෙළෙඳ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සහ රටෙහි සාර්ව ආර්ථික තත්ත්වයන් වර්ධනය වීම හේතුවෙන් අපනයන ආදායම ඉහළ ගියේය. තවද, යුරෝපා සංගමයේ විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී. ප්ලස්) ප්‍රතිස්ථාපනය කිරීම, සිංගප්පූරුව, චීනය සහ ඉන්දියාව සමඟ නිදහස් විදේශ වෙළඳ ගිවිසුම් අපේක්ෂිත ලෙස සම්පූර්ණ කිරීම සහ ශක්තිමත්

ආයතනික සහ ප්‍රතිපත්තිවල දායකත්වය තුළින් අපනයන තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2017 වසරේ දී **විදේශීය සෘජු ආයෝජනවල** වර්ධනය වීමක් දැකිය හැකි වූ අතර, හම්බන්තොට කාර්මික කලාපය ආරම්භ කිරීම සහ කොළඹ වරාය නගර ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම තුළින් විදේශීය සෘජු ආයෝජන තවදුරටත් වර්ධනය වනු ඇතැයි  අපේක්ෂා කෙරේ. වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙත සහ කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත මෙන්ම රජය වෙත ද දිගුකාලීන මුදල් ලැබීම් වාර්තා විය.  විදේශ අංශයේ මෙම වර්ධනයන් හමුවේ ශ්‍රී ලංකා මහ බැංකුවට දළ නිල සංචිත මට්ටම 2017 වසර අවසානය වන විට එ.ජ.ඩොලර් බිලියන 7.9 ක් ඉක්මවා ඉහළ නංවා ගැනීමට හැකිවිය.

රාජ්‍ය මූල්‍ය අංශය සැලකීමේ දී රටෙහි රාජ්‍ය මූල්‍ය ශක්තිමත් කිරීම සඳහා රජය විසින් ආදායම මූලික කරගත් **රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා** පිළිවෙතක් අනුගමනය කළේය. රජය 2020 වසර වන විට අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3.5 ක් දක්වා අඩු කර ගැනීමට අපේක්ෂා කරන අතර, එමගින් මැදි කාලීනව රාජ්‍ය ණය වඩා තිරසාර මට්ටමකට අඩු කර ගැනීමට බලාපොරොත්තු වේ. මැදිකාලීනව අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව අත්කර ගැනීමට, රාජ්‍ය ආදායම වර්ධනය කිරීම සඳහා සහ රාජ්‍ය වියදම් තාර්කිකරණය කිරීම සඳහා රජය විසින් නොයෙකුත් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කෙරේ. 1950 දශකයේ මුල් වකවානුවට පසුව පළමු වරට 2017 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ අතිරික්තයක් අපේක්ෂා කරන අතර, 1987 වසරෙන් පසු පළමු වරට 2018 වසරේ දී ජංගම ගිණුමේ ද අතිරික්තයක් අපේක්ෂා කෙරේ.  රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ මූල්‍ය ශක්‍යතාවය වැඩි කිරීම තුළින් අයවැය වෙත වන බලපෑම අවම කිරීම ද රජයේ ප්‍රතිසංස්කරණ වැඩසටහනෙහි ඇතුළත් වේ.

2017 වසරේ දී මුදල් සහ විනිමය අනුපාතික ප්‍රතිපත්ති වෙනුවෙන් පැහැදිලි ක්‍රමවේද සහ ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන අතරතුර, 2017 වසරේ දී මූල්‍ය අංශයේ අභියෝගවලට මුහුණ දීමටත්,  මුදල් ප්‍රතිපත්තිය වඩාත් කාර්යක්ෂමව සම්ප්‍රේෂණය වීමටත්, තිරසාර ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමටත් දායක වන ස්ථාවර මූල්‍ය පද්ධතියක් පවත්වාගෙන යෑම සඳහා ද අප විසින් නොයෙකුත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ඇත. මූල්‍ය අංශය, වඩා **ගතික සහ ස්ථාවර මූල්‍ය අංශයක් බවට ප්‍රවර්ධනය කිරීම** සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන සහ අධීක්ෂණ රාමුව ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදවලට සහ භාවිතාවන්ට අනුකූලව තවදුරටත් ශක්තිමත් කෙරිණි. මේ වන විට, අපගේ බැංකු අංශය රුපියල් ට්‍රිලියන 10ක් ඉක්මවා වත්කම් පවත්වාගෙන යන අතර, බැංකු නොවන මූල්‍ය ආයතන අංශය රුපියල් ට්‍රිලියන 1ක් ඉක්මවා වත්කම් ප්‍රමාණයක් පවත්වාගෙන යයි. බැංකු අංශය වඩාත් ශක්තිමත් කිරීම සඳහා බාසල් III යටතේ වන ප්‍රාග්ධන සම්මතයන් ක්‍රියාත්මක කිරීම 2017 වසරේ දී ආරම්භ කෙරුණි. අභියෝග මධ්‍යයේ බැංකු නොවන මූල්‍ය ආයතන නියාමනය කිරීමේ රාමුව වඩාත් ශක්තිමත් වූ අතර, පීඩාවට පත් මුදල් සමාගම් බේරුම් කිරීම ද ආරම්භ විය. 2017 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල නියාමන රාමුව තවදුරටත්

ශක්තිමත් කළ අතර, අනෙකුත් රාජ්‍ය ආයතනවල ද අනුග්‍රහය ඇතිව නීති විරෝධී පිරමීඩ මැඩලීමට අඛණ්ඩව පියවර ගත්තේය. රටෙහි කාර්යක්ෂම හා ස්ථාවර ගෙවීම් සහ පියවීම් පද්ධතියක් ඇති කිරීම සඳහා සහ ඩිජිටල් ආර්ථිකයක් දක්වා වැඩිදියුණු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් යටිතල පහසුකම් ශක්තිමත් හා නවීකරණය කිරීමට නොයෙකුත් ක්‍රියාමාර්ග ගැනුණි.

විශ්වසනීය, වෘත්තීය නිපුණතාවයෙන් යුතු ශක්තිමත් ආයතනයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවට ඉතා වැදගත් **නියෝජිත කාර්යයන්** පැවරී ඇත. අප වෙත ලබා දී ඇති බලතලවලට අනුගතව, අවම පිරිවැයකින් සහ විචක්ෂණශීලී අවදානම් මට්ටමක් යටතේ රජයේ මූල්‍ය අවශ්‍යතා සඳහා අරමුදල් එක්රැස් කර ගැනීමේ අරමුණෙන් රාජ්‍ය ණය කළමනාකරණය සිදු කළෙමු. රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා වෙළෙඳපොළ පදනම් කරගත් විනිවිදභාවයකින් යුතු වෙන්දේසි යාන්ත්‍රණයක් හඳුන්වා දීම මගින් රාජ්‍ය ණය කළමනාකරණ රාමුව සවිබල ගන්වන ලදි. මෙම ක්‍රමවේදය හේතුකොටගෙන රජයට ණය සඳහා දැරිය යුතු පිරිවැය අඩුවීම, කාර්යක්ෂම මිල ගවේෂණයකට ඇති හැකියාව සහ පදනම් එලදා වක්‍රය හරහා වැඩි දියුණු වූ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ සංඥාවන් ලබා දීම වැනි අභිමත ප්‍රතිඵල ළඟා කර ගැනීමට හැකි විය. රටේ විශාලතම විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල වන සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය කරනු ලබන්නේ මහ බැංකුව විසිනි. එම අරමුදල සතු මුළු වත්කම් ප්‍රමාණය 2017 වසරේ දී රුපියල් ට්‍රිලියන 2.0 ඉක්මවා යෑම සුවිශේෂී සංධිස්ථානයක් විය. මහ බැංකුව මූල්‍ය සාක්ෂරතාව සහ මූල්‍ය අන්තර්ග්‍රහණය ප්‍රවර්ධනයට ද අඛණ්ඩව දායක වූ අතර, කෘෂිකාර්මික සහ පශු සම්පත් අංශ වෙත මෙන්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශ වෙත අපගේ ණය යෝජනා ක්‍රම හරහා ණය ලබා දීම මගින් ව්‍යවසායකත්ව සංවර්ධනයට සහාය විය. මීට අමතරව, අප විසින් රට තුළ පිරිසිදු නෝට්ටු භාවිතය ප්‍රචලිත කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලැබූ අතර ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු හා සැකසුම් කටයුතු ද වැඩිදියුණු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත පදනම් කර ගනිමින් විදේශ විනිමය මෙහෙයුම් සඳහා නව ව්‍යවස්ථාපිත හා ප්‍රතිපත්තිමය රාමුවක් ක්‍රියාත්මක කළේය. සීමා කිරීම් අවම කිරීම, අවිනිශ්චිතතාවයන් බැහැර කිරීම, ක්‍රියාවලීන් සරල කිරීම මෙන්ම පැහැදිලි බව හා පහසුව සහතික කරමින් විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් නව පනතේ විධිවිධානයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අභිනවයෙන් ස්ථාපිත විදේශ විනිමය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාවට නංවනු ඇත.

මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදී කටයුතු මූල්‍යනය කිරීම වැළැක්වීමේ නියාමනයන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ගෝලීය ශ්‍රේණිගත කිරීම් තුළ ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත වීම වැඩිදියුණු කර ගැනීම සඳහා සැලකිය යුතු ක්‍රියාමාර්ග රැසක් ගත යුතුව ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය, රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මෙන්ම බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය ආයතන, නියාමන ආයතන, කොටස් තැරැව්කරුවන් හා රක්ෂණ සමාගම් වැනි සිය පාර්ශ්වකරුවන් සමඟ එක්ව මුදල්

විශුද්ධිකරණය හා ත්‍රස්තවාදී කටයුතු මූල්‍යනය කිරීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග රැසක් ගනිමින් සිටින අතර, අනෙකුත් රටවල මූල්‍ය බුද්ධි ඒකක සමඟ නව අවබෝධතා ගිවිසුම්වලට එළඹීම අඛණ්ඩව සිදු කළේය.

රටේ ආර්ථික ස්ථාවරත්වය ඉහළ නැංවීම සඳහා මහ බැංකුව ක්‍රියාමාර්ග රැසක් ආරම්භ කර ඇති අතර, ඉදිරියේ දී ද මෙම කාර්යභාරය තවදුරටත් ඉටු කරනු ඇත. වර්ධිත ආර්ථික මූලධර්ම හා ස්ථාවරත්වය හමුවේ ආර්ථිකයේ පවතින පහළ වර්ධන ප්‍රවණතාවයන්ගෙන් ඉවත්ව එහි විභව මට්ටමට **ආර්ථිකය නගාසිටුවීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ** රජය විසින් ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. රජයේ “2025 දැක්ම” මගින් රටෙහි අනාගත ප්‍රතිපත්ති දිශානතිය අනාවරණය කෙරේ. මෙමගින් දැනුම පදනම් කරගත්, ඉහළ තරගකාරිත්වයකින් යුතු සමාජ වෙළඳපොළ ආර්ථිකයක් මගින් ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම අපේක්ෂා කෙරේ. ඒ අනුව, දේශීය වෙළෙඳපොළ සීමාවන් හේතුවෙන් විදේශීය ඉල්ලුම පදනම් කරගත් අනාගතයේ දී තිරසාර ආර්ථික වර්ධනයක් උත්පාදනය කළ යුතුව ඇත. එබැවින්, වෙළඳ හා ආයෝජන අවස්ථා උපරිම ලෙස උපයෝජනය කරමින් විදේශ වෙළඳපොළට පිවිසීම සඳහා ඵලදායී හා තිරසාර දිගුකාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

නිතර ඇති වූ **ස්වභාවික විපත්** ආර්ථික ක්‍රියාකාරිත්වයට බාධා කිරීම හේතුවෙන් ආර්ථික වර්ධනයේ පහළ යෑමක් අපට දැක ගත හැකිවිය. එමගින්, ආර්ථිකයේ වර්ධන ප්‍රවාහයන් විවිධාංගීකරණය කිරීම මෙන්ම, ආර්ථිකයේ තිරසාරබව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා අයවැය සම්පාදන ක්‍රියාවලියේ දී ඒවා සලකා බැලීම හා ආපදා තත්ත්වයන්ට පෙර සූදානම් වීම තුළින් ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ.

ගෝලීය තත්ත්වයන් සැලකීමේදී, ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසුව දිගින් දිගටම ඇතිවූ බාධාවන් හා අහිතකර කම්පනයන්ගෙන් පසුව මේ වන විට **ගෝලීය ආර්ථිකය** ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වෙමින් ඇත. ආයෝජන තත්ත්වයන් වැඩිදියුණු වී ඇති අතර, ගෝලීය වෙළෙඳාම ද 2017 වසරේ දී යළි යථා තත්ත්වයට පත් විය. එබැවින්, ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසු පළමු වරට යුරෝපය, ජපානය හා එක්සත් ජනපදය යන සියලුම රටවල එකවර දැකිය හැකි වූ ආර්ථික ප්‍රසාරණයන් තුළින් යළි නගාසිටුවන ලද ගෝලීය ආර්ථික වර්ධනය මගින් නිර්මාණය කරන ලද අවස්ථාවන් අප විසින් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගත යුතුව ඇත. ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳපොළවල් වන යුරෝපයේ හා එක්සත් ජනපදයේ ආර්ථිකයන්ගේ යහපත් ප්‍රවණතාවන්, අපගේ ආර්ථික වර්ධනයට හිතකර ලෙස දායක වනු ඇත. කෙසේ වෙතත්, දියුණු රටවල මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රමානුකූලව සාමාන්‍යකරණය කිරීම කෙරෙහි අප විසින් අවධානය යොමු කළ යුතුව ඇති අතර, එය ශ්‍රී ලංකා ආර්ථිකයේ විදේශ හා රාජ්‍ය මූල්‍ය අංශයන් මත යම් බලපෑමක් ඇති කළ හැකිය.

ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් ආර්ථිකයක් බවට ක්‍රමයෙන් පත්වෙමින් සිටී. මෙම ප්‍රගතිය තිරසාර ලෙස පවත්වා ගැනීමට ලෝක ආර්ථිකය සමඟ ඉහළ ඒකාබද්ධතාවයක් තවදුරටත් පවත්වා ගැනීම අනිවාර්යයෙන්ම කළ යුතුය. ලෝක ආර්ථිකය සමඟ බද්ධ වීම සඳහා දරනු ලබන උත්සාහයන් හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය දැඩි අස්ථාවර තත්ත්වයන්ට හා අවදානම්වලට ද මුහුණ දෙනු ඇත. වත්මන් හා අනාගත අභියෝගවලට විචක්ෂණශීලීව මුහුණ දීම සඳහා සහ පවත්නා ක්‍රියාවලියන්හි මේ වන විටත් හඳුනා ගෙන ඇති දුර්වලතාවලට පිළියම් යෙදීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සිය නවතම ක්‍රමෝපායික සැලැස්මෙහි දක්වා ඇති පරිදි (අ) මුදල් ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කිරීම; (ආ) මූල්‍ය අංශයේ අධීක්ෂණය සවිමත් කිරීම; (ඇ) ගෙවීම් හා පියවීම් පද්ධති නවීකරණය කිරීම; (ඈ) රාජ්‍ය ණය කළමනාකරණය යාවත්කාලීන කිරීම තුළින් **සිය ආයතනික රාමුව දැඩි ලෙස ශක්තිමත් කිරීමට** අපේක්ෂා කෙරේ.

**වැඩිදියුණු කරන ලද ප්‍රතිපත්ති රාමුව** මගින් ලෝක ආර්ථිකයන් සමඟ මනා සම්බන්ධතාවයකින් යුතුව කටයුතු කිරීමට හැකිවනු ඇති අතර, එය අවදානම් තත්ත්වයන් අවම කිරීමට හා ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමට උපකාරී වනු ඇත. මේ සම්බන්ධයෙන් පෙර සඳහන් කළ පරිදි, මිල ස්ථායීතාවය තහවුරු කිරීම සඳහා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් නිර්මාණය කිරීමට අපි අඛණ්ඩව කටයුතු කරමින් සිටිමු. එමෙන්ම, මූල්‍ය පද්ධතියේ දුර්වලතා අඩු කිරීම සඳහා ගතික හා ඉහළ ඔරොත්තු දීමේ හැකියාවකින් යුතු මූල්‍ය අංශයක් නිර්මාණය කිරීමෙහිලා අපි කටයුතු කරමින් සිටිමු. මෙය ආර්ථික වර්ධනය, සේවා නියුක්තිය හා ආදායම් හා සබැඳි අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා මූලික වනු ඇත. ව්‍යවහාර මුදල් භාවිතය අඩු සමාජයක් සඳහා මංපෙත් විවර කිරීම සහ ඩිජිටල් ආර්ථිකයක් සඳහා පහසුකම් සැලසීම මගින් ගෙවීම් හා පියවීම් පද්ධතිවල යටිතල සහසුකම් නවීකරණය කිරීම මැදිකාලීනව වැදගත් ප්‍රතිපත්ති ප්‍රමුඛතාවන් වේ. රාජ්‍ය ණයවල තිරසාර භාවය තහවුරු කිරීම, ප්‍රාථමික වෙන්දේසි පද්ධතියේ කාර්යක්ෂමතාවය හා විනිවිදභාවය ඉහළ නැංවීම, වෙළඳපොළ සංවර්ධනය හා අවදානම් අවම කිරීම අරමුණු කර ගනිමින් විචක්ෂණශීලී ණය කළමනාකරණයක් සිදු කිරීමට අපි කැප වී සිටිමු. රටේ ආර්ථික හා මිල ස්ථාවරත්වය ද, මූල්‍ය පද්ධති ස්ථාවරත්වය ද සඳහා උපකාරී වන මෙම උපාය මාර්ගික ප්‍රමුඛතාවයන් සපුරා ගැනීම සඳහා අපගේ ප්‍රතිපත්ති පෙළගැසෙනු ඇත. මෙම සන්දර්භය තුළ, 2018 වසරේ ප්‍රතිපත්ති පෙර දැක්ම මගින් 2017 වසර තුළ ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමාලෝචනය කෙරෙන අතර, විශේෂයෙන්ම, ඉදිරියේ දී අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ද ඉදිරිපත් කෙරේ.

ඒ අනුව, 2018 ප්‍රතිපත්ති පෙර දැක්මෙහි පෙළගැස්ම පහත සඳහන් පරිදි වේ.

- 2 වන කොටස : 2018 වසර සහ ඉදිරිය සඳහා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති උපායමාර්ගය සහ ප්‍රතිපත්ති
- 3 වන කොටස : 2018 වසර සහ ඉදිරිය සඳහා මූල්‍ය අංශයේ ක්‍රියාකාරීත්වය සහ ස්ථාවරත්වය සඳහා අදාළ වන මහ බැංකු ප්‍රතිපත්ති
- 4 වන කොටස : මහ බැංකුවේ නියෝජිත සහ අනුයාත කාර්යයන් තුළින් ආර්ථිකය වඩා පුළුල් ලෙස ශක්තිමත් කිරීම හා සම්බන්ධ මූලික ප්‍රතිපත්ති

මෙතැන් සිට මෙම එක් එක් අංශයන් පිළිබඳව සවිස්තරාත්මකව විග්‍රහ කිරීමක් සිදු කෙරෙනු ඇත.

## 2. 2018 වසර සහ ඉදිරිය සඳහා මුදල් ප්‍රතිපත්ති උපායමාර්ගය සහ ප්‍රතිපත්ති

මිල ස්ථායිතාව පවත්වාගෙන යෑමේ කාර්යභාරය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී තිබේ. තිරසාර සංවර්ධනයක් සඳහා හේතුසාධක වන පරිසරයක් සකස් කර ගැනීමට මෙන්ම, මහජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම තහවුරු කිරීම සඳහා මිල ස්ථායිතාව පවත්වා ගැනීම මූලික අවශ්‍යතාවක් වේ.

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තුළින් සිය මිල ස්ථායිතා අරමුණු ඉටු කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමුව මත පදනම් වී, දශකයකට ආසන්න කාලයක් පුරා උද්ධමනය තනි අගයක පවත්වාගෙන යෑමට අපට හැකි විය.

ඉදිරියේදී, සාර්ථක නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් හඳුන්වා දීම මගින් මිල ස්ථායිතාව පවත්වාගෙන යෑමට අපට ඇති හැකියාව තවදුරටත් වර්ධනය වනු ඇත. ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට සහ රැකියා අවස්ථා බිහි කිරීමට අවස්ථාවක් මෙමගින් උදා වනු ඇත.

මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස උද්ධමන ඉලක්කරණය වෙත නැඹුරුවීම අපගේ අභිප්‍රාය වන බව වසර ගණනාවකට පෙර අප විසින් සඳහන් කොට ඇති අතර, ඉහළ උද්ධමන - අඩු වර්ධන උගුලෙන් මිදීමට ඇති වඩාත්ම සුදුසු ක්‍රියාමාර්ගය එය බව අප විසින් හඳුනා ගෙන ඇත. මුදල් සහ උද්ධමනය අතර පවත්නා දුර්වල සම්බන්ධතාව සහ මූල්‍ය වෙළඳපොළ වැඩිදියුණු වීම යන කරුණු නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් වෙත යොමු වීමට අපව දිරිමත් කළ ප්‍රධාන සාධක අතර වේ.

යෝජිත නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ උද්ධමනය සියයට 4 – 6 අතර පරාසයක පවත්වා ගැනීම ඉලක්ක කර ගනිමින් ආර්ථිකයේ මිල ස්ථායිතාව පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. සැපයුම් හෝ බාහිර කම්පන හේතුවෙන් ආර්ථිකය මත අවදානම් පවතින අප වැනි රටවලට මෙම ඉලක්කගත පරාසය යෝග්‍ය බව අපගේ විශ්වාසයයි. උද්ධමනය ඉලක්කගත මැදි තනි අගයක පවත්වා ගැනීමට සහ වෙළඳපොළ තත්ත්ව මත බලපෑම් ඇති කිරීමට වෙළඳපොළ පදනම් කරගත් උපකරණ, විශේෂයෙන්ම ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ විවට වෙළඳපොළ කටයුතු, භාවිත කිරීමට අපි අපේක්ෂා කරමු. සමස්ත මුදල් ප්‍රසාරණය සහ වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයනු ලබන ණය ප්‍රමාණය වැනි විචල්‍ය තවදුරටත් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා මග පෙන්වන ප්‍රධාන දර්ශක විචල්‍ය වශයෙන් පවතිනු ඇත.

මෙම නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව වෙත ක්‍රමයෙන් නැඹුරු වීමේ ක්‍රියාවලිය සාක්ෂාත් කර ගැනීම සඳහා කාල රාමුවක් සහිත සැලසුමක් මේ වන විට අපි අනුගමනය කරමින් සිටිමු. විශේෂයෙන්

2018 වසරේ සිට ආරම්භ වන කාලපරිච්ඡේදය, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව වෙත නැඹුරු වීමේ ක්‍රියාවලියට පහසුකම් සැපයීම සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රතිසංස්කරණ සිදු කිරීම සම්බන්ධයෙන් ඉතා වැදගත් වනු ඇත.

මෙහිදී, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව වෙත නැඹුරු වීමේ ක්‍රියාවලිය සඳහා වැදගත් වන ප්‍රධාන අංග තුනක් අප විසින් හඳුනා ගෙන ඇත;

1. මහ බැංකුවෙහි බලතල සහ එහි විශ්වසනීයත්වය ශක්තිමත් මට්ටමක පැවතීම
2. සාර්ථක මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග
3. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය වෙතින් ලැබිය යුතු සහයෝගීතාව සහ කැපවීම ශක්තිමත් මට්ටමක පැවතීම

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවෙහි ප්‍රධාන අංග සහ ඊට පදනම් වන ප්‍රධාන අවශ්‍ය සාධක කිහිපයක් විස්තරාත්මකව සාකච්ඡා කළ හැකිය.

**මහ බැංකුවේ බලතල ශක්තිමත් කිරීම සහ එහි විශ්වසනීයත්වය තහවුරු කිරීම** නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත ගමන් කිරීම සාර්ථක කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. නීතිමය බලතල මෙන්ම මහ බැංකු ස්වාධිපත්‍ය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය අසාර්ථක වූ අවස්ථා පිළිබඳ පැහැදිලි සාක්ෂි ලොව පුරා දක්නට ලැබේ. මේ අනුව සැලකීමේ දී, ශ්‍රී ලංකාව ද අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනට ලැබී ඇති බලතල සඳහා සැලකිය යුතු වෙනස්කම් සිදු කිරීමට පියවර ගත යුතුව ඇත. මූලික නොවන ක්‍රියාකාරකම් කෙරෙහි මහ බැංකුව අවධානය යොමු කිරීම, රජයේ අයවැය මූල්‍යනය සඳහා මහ බැංකුව කටයුතු කිරීම සහ ප්‍රමාණවත් නොවන ස්වාධීනතාව හේතුවෙන් වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමුවේ සාර්ථකත්වයට බාධා එල්ල වී ඇත. මෙම සාධක, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත ගමන් කිරීමේදී පවතින ව්‍යුහාත්මක අවහිරතා වේ. මේ අනුව, බලතලවල නිශ්චිත බව වැඩිදියුණු කිරීම මෙන්ම මහ බැංකුවේ ස්වාධීනත්වය, පාලනය, විනිවිදභාවය සහ වගවීම ඉහළ නැංවීම සඳහා මුදල් නීති පනත සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය වේ. මිල ස්ථායීතාවට අදාළ විධිවිධාන ශක්තිමත් කිරීම, මුදල් සහ රාජ්‍ය මූල්‍ය කාර්යයන් එකිනෙකින් වෙන් කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම, උද්ධමන ඉලක්කකරණය ස්ථාපිත කිරීමට අවශ්‍ය ආයතනික රාමුව පිළියෙළ කිරීම සහ වගවීම පවත්වාගෙන යෑම මෙම ප්‍රතිසංස්කරණ තුළ පුළුල් වශයෙන් අන්තර්ගත වේ.

දෙවනුව, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ අඩු උද්ධමනයක් පවත්වා ගෙන යෑම සඳහා අත්‍යවශ්‍ය අංගයක් වන **සාර්ථක මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග** තහවුරු කිරීම සඳහා විශ්වසනීය සාර්ව ආර්ථික

පුරෝකථන මත පදනම් වූ ඉදිරි දැක්මක් සහිත මනා තීරණ ගැනීමේ ක්‍රියාවලියක් අප විසින් ස්ථාපිත කළ යුතුව ඇත. මීට අදාළව, ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය ආකෘතිකරණය හා පුරෝකථනය සඳහා අවශ්‍ය වන තාක්ෂණික දැනුම මහ බැංකුව විසින් මේ වනවිටත් වැඩිදියුණු කර ඇත. නුදුරු කාලීන සහ මැදි කාලීන ආකෘති මත පදනම් වූ පුරෝකථන අන්තර්ගත වන ව්‍යුහාත්මක ආකෘති අනුව ගොඩනංවන ලද පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියක් (Forecasting and Policy Analysis System - FPAS), ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජා.මු. අරමුදල හා එක්ව වැඩිදියුණු කර ඇත. වත්මන් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය, පුරෝකථන ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය මත පදනම් වූ විශ්ලේෂණ හා අනුගතව ක්‍රමයෙන් ක්‍රියාත්මක කෙරෙමින් පවතී. එමගින්, මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය සඳහා පූර්ව ක්‍රියාමාර්ග ගැනීමට සහ ඉදිරි දැක්මක් සහිතව ක්‍රියාත්මක කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. උද්ධමන ඉලක්කකරණය සහ සාර්ව ආර්ථික විශ්ලේෂණ සඳහා අවශ්‍ය තාක්ෂණික යටිතල පහසුකම් සැපයීම මගින් ආකෘති මත පදනම් වූ පුරෝකථන තවදුරටත් වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

තවද, වැදගත් ආර්ථික දත්ත සහ සිදුවීම් සම්බන්ධ තොරතුරු ලබා ගැනීම අනුව පුරෝකථන වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සහ පුරෝකථිත දත්ත සඳහා වන සංශෝධන සලකා බැලීම සඳහා පුරෝකථන දින දර්ශනයක් හඳුන්වා දීම මගින් මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කර ඇත. ඒ අනුව, සෑම මුදල් ප්‍රතිපත්ති වාරයකදී ම පුරෝකථන සඳහා වන දත්ත ලබා ගැනීමට සහ පුරෝකථන පිළිබඳ පසු අදහස් ලබා ගැනීම සඳහා තාක්ෂණික කාර්ය මණ්ඩල මට්ටමේ රැස්වීම් දෙකක් පැවැත්වීමෙන් අනතුරුව, පුරෝකථන මෙන්ම ආර්ථිකයේ සෑම අංශයකම ප්‍රවණතා පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටු සාමාජිකයන් සහ තාක්ෂණික කාර්යමණ්ඩලයේ සහභාගිත්වයෙන් යුතුව පූර්ව මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීමක් පවත්වනු ලැබේ. මුදල් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන මුදල් ප්‍රතිපත්ති කමිටුව ඉන්පසුව රැස් වේ. වඩාත් සංකීර්ණ සාර්ව ආර්ථික විශ්ලේෂණ සිදු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් තාක්ෂණික කාර්යමණ්ඩලයට ලබා දීමේ අරමුණින් වසරක් තුළ පැවැත්වෙන මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම් ගණන අටක් දක්වා අඩු කොට ඇත.

ඉදිරි දැක්මකින් යුතු නව රාමුව තුළ, වත්මන් සහ අනාගත ආර්ථික තත්ත්වයන්ගේ ප්‍රවණතා අධීක්ෂණය කිරීම ඉතා වැදගත් වේ. ඒ අනුව, ඉදිරි දැක්මක් තුළින් පුරෝකථනවල නිරවද්‍යතාව ඉහළ නැංවීම සඳහා ආර්ථිකයේ අපේක්ෂා සහ ආර්ථික තත්ත්වයන් පිළිබඳ දැනට පවතින විවිධ වෙළඳපොළ අපේක්ෂා පිළිබඳ සමීක්ෂණ වැඩිදියුණු කිරීමට අපි අපේක්ෂා කරමු.

මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් පිළිබඳ සැලකූ විට, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මත පදනම්ව බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය හැසිරවීම සඳහා විවට වෙළඳපොළ කටයුතු තුළින් දේශීය මුදල් වෙළඳපොළ සක්‍රීයව මෙහෙයවීම සිදු කෙරෙයි. වෙළඳපොළ වෙත වැදගත් තොරතුරු සන්නිවේදනය

කිරීම සඳහා අප විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග අතර මුදල් වෙළඳපොළ මිල අනාවරණය සහ වෙළඳපොළ සහභාගීවන්නන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය දිරිගැන්වීම මෙන්ම විවට වෙළඳපොළ කටයුතු සඳහා වෙළඳපොළ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් විවට වෙළඳපොළ වෙන්දේසියේ දී තීරණය වන උපරිම ඵලදා අනුපාතික සීමාව සහ එක් දින ද්‍රවශීලතා ඇස්තමේන්තු සිදු කිරීම වැනි ක්‍රියාමාර්ග ඇතුළත් වේ. කෙටිකාලීන පොලී අනුපාතික අපේක්ෂිත දිශාවට මෙහෙයවන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද්‍රවශීලතා කළමනාකරණය කිරීම සඳහා සක්‍රීයව කටයුතු කරනු ඇත. මුදල් වෙළඳපොළ කටයුතුවල කාර්යක්ෂමතාව සහ අනුකූලතාව වැඩිදියුණු කිරීම සඳහා පොලී අනුපාතික සංඛ්‍යාන සැකසීමේ ක්‍රමවේද, එක්දින ද්‍රවශීලතා පහසුකම සඳහා අදාළ මෙහෙයුම් රාමුව වැඩිදියුණු කිරීම සහ බලයලත් මුදල් තැරැව්කරුවන් සඳහා රීති පාදක කරගත් මෙහෙයුම් රාමුවක් ඉදිරිපත් කිරීම සහ වෙළඳපොළ ප්‍රවර්ධනය කිරීම වැනි පියවර කිහිපයක් ඉදිරියේදී ක්‍රියාවට නංවනු ඇත.

පසුගිය වසරේදී නිවේදනය කළ පරිදි, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා බාහිර ප්‍රවීණයන්ගේ සහාය ලබා ගැනීමේ අරමුණින් 2017 වසර මැද දී මුදල් ප්‍රතිපත්ති උපදේශක කමිටුව නැවත ස්ථාපිත කෙරිණ. පාර්ශ්වකරුවන්ගේ අදහස් අප විසින් නිරන්තරයෙන් සැලකිල්ලට ගනු ලබන අතර, පාර්ශ්වකරුවන්ට මෙන්ම මහ බැංකුවට ද ඵලදායී වන පරිදි අපගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, විචක්ෂණ හා ඵලදායී විනිමය අනුපාත ප්‍රතිපත්තියක් මත රඳා පවතින බැවින් මහ බැංකුව විසින් වඩාත් වෙළඳපොළ මත පදනම් වූ **විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රමයක්** හඳුන්වා දී ඇත. ඒ යටතේ, වෙළඳපොළ තත්ත්වයන් මත පදනම්ව විනිමය අනුපාතිකය වඩාත් නම්‍යශීලීව තීරණය වීමට ඉඩ සලසා ඇති අතර, විනිමය අනුපාතික විචලතාව අවම කිරීමට සහ සංචිත ගොඩනැගීම සඳහා පමණක් ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත් වී ඇත. විනිමය අනුපාතික මත අවම බලපෑමක් ඇති කරමින් 2017 වසරේ දී ණය නොවන මූලාශ්‍ර හරහා ජාත්‍යන්තර සංචිත ගොඩනැගීම සැලකිය යුතු කරුණකි. ඉදිරියේ දී, නම්‍යශීලී විනිමය අනුපාතිකයකට අනුකූල වන පරිදි සහ විදේශ විනිමය වෙළඳපොළ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමට සහාය වීමේ අරමුණින් විදේශ විනිමය වෙළඳපොළට මැදහත් වීමේ ප්‍රතිපත්ති අනුගමනය කරනු ඇත. තරගකාරී විනිමය අනුපාතිකයක් පවත්වා ගෙන යෑම මහ බැංකුවේ වැදගත් අරමුණකි.

මෙම ප්‍රතිපත්තියට අනුකූලව, සංචිත ගොඩනැගීමේ දී **ණය නොවන මූල්‍ය ප්‍රවාහ** කෙරෙහි අපි තවදුරටත් අවධානය යොමු කරන්නෙමු. දැනට ක්‍රියාත්මක වන රජයේ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, අපනයන ඉහළ නැංවීම මෙන්ම සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ අනුව, තරගකාරීත්වය ඉහළ නැංවීම සඳහා නම්‍යශීලී විනිමය අනුපාතිකයක් පවත්වා ගෙන යෑම සඳහා වූ

අපගේ ප්‍රතිපත්තියට ඉහළ වැදගත්කමක් හිමි වේ. 2017 වසරේ දී සෘජු විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් බිලියන 1.5 දක්වා ළඟා වී ඇති බව ආයෝජන මණ්ඩලය විසින් ඇස්තමේන්තු කර ඇති අතර, එය සෘජු විදේශ ආයෝජනවල සන්ධිස්ථානයක් මෙන්ම සෘජු ආයෝජන ප්‍රවාහ ගලාඒම්වල හැරවුම් ලක්ෂයක් ද විය හැක. හම්බන්තොට කාර්මික කලාපය ආරම්භ කිරීම හා කොළඹ වරාය නගර ව්‍යාපෘතිය අඛණ්ඩව ඉදිරියට ගෙන යාම හේතුවෙන් 2018 වසරේ සිට සැලකිය යුතු සෘජු විදේශ ආයෝජන ගලා ඒමක් සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉදිරි වසර කිහිපය තුළ දී එ.ජ. ඩොලර් බිලියන 2 – 3 අතර වාර්ෂික සෘජු විදේශ ආයෝජන බලාපොරොත්තු වේ. විදේශ සෘජු ආයෝජන ගලාඒම්, ආර්ථික වර්ධනය වේගවත් කිරීමට සහ රැකියා අවස්ථා බිහි කිරීමට සහාය වීමට අමතරව, ණය නොවන මූල්‍ය ප්‍රවාහ උත්පාදනය සහ අපනයන වැඩි කිරීම හරහා බාහිර අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කරනු ඇත.

ප්‍රමාණවත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීමේ සහ සාධාරණ ප්‍රතිලාභ අනුපාතිකයක් ලබා ගැනීමේ අරමුණු ඇතිව විදේශ විනිමය සංචිත කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා මහ බැංකුව **උපායමාර්ගික වත්කම් වෙන් කිරීමේ රාමුවක්** මත පදනම් ආකෘතියකට අනුකූලව සංචිත කළමනාකරණය අඛණ්ඩව කරගෙන යනු ඇත.

උද්ධමන ඉලක්කකරණය තුළ 'අපේක්ෂා කළමනාකරණය'ට ඉහළ ප්‍රමුඛතාවක් ලැබේ. මුදල් ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් අනාගත පොලී අනුපාතික, උද්ධමනය සහ ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ පෞද්ගලික අංශයේ අපේක්ෂාවන් කෙරෙහි බලපාන අතර, ඒ හරහා උද්ධමනය සහ මූර්ත ආර්ථිකය කෙරෙහි බලපෑම් කරයි. මේ තත්ත්වය තුළ, මුදල් ප්‍රතිපත්තියේ විනිවිදභාවය අතිශයින් වැදගත් වේ. මෙමගින් **ඵලදායී සන්නිවේදනයේ** ඇති සුවිශාල වැදගත්කමක් පෙන්වා දෙයි. ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා ඵලදායී ලෙස පාලනය කර ගැනීම සඳහා අපගේ සන්නිවේදන කටයුතු විවෘතව, අරමුණුසහගතව සහ යාවත්කාලීනව සිදු විය යුතු බව අපි විශ්වාස කරමු. එම නිසා, නව මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ මහජනතාවගේ අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සිය සන්නිවේදන උපායමාර්ග වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කරමින් සිටී.

සන්නිවේදන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා දැනටමත් ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත. මෙම ප්‍රතිපත්ති පෙර දැක්ම අපගේ සන්නිවේදන උපාය මාර්ගයෙහි ප්‍රමුඛස්ථානයක් ගනී. වසර පුරා නිකුත් කරනු ලබන ප්‍රකාශන, පුවත්පත් නිවේදන සහ මාධ්‍ය සාකච්ඡා හරහා මෑදි කාලීනව ආර්ථිකයේ සාර්ව ආර්ථික දිශානතිය පිළිබඳව අප විසින් දැනටමත් දැනුම්වත් කිරීම් සිදු කර ඇත. තවද, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සඳහා සැකසූ පෙර දැක්මට අනුව, මුදල් ප්‍රතිපත්ති විවරණ ප්‍රකාශනයෙහි විශ්ලේෂණාත්මකභාවය තවදුරටත් වැඩිදියුණු කිරීම, මුදල් ප්‍රතිපත්ති වාර්තා නිතිපතා නිකුත් කිරීම, උද්ධමන වාර්තා ප්‍රකාශයට පත් කිරීම සහ මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩපිළිවෙලවල් ආරම්භ කිරීම

ඇතුළත් තවත් ක්‍රියාමාර්ග කිහිපයක් ද නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සඳහා වන ගමන් මගෙහි ඇතුළත්ව ඇත.

මුදල් ප්‍රතිපත්ති නිවේදන සඳහා **මුදල් ප්‍රතිපත්ති දැනුම් දීමේ දින දර්ශනයක්** හඳුන්වා දීමේ අපගේ ප්‍රයත්නයට අනුව 2018 වසර සඳහා වන දින දර්ශනය පහත පරිදි වේ.

2018 වසරේ මුදල් ප්‍රතිපත්ති නිවේදන

| | |
|---|---|
| 1 | පෙබරවාරි 16, සිකුරාදා |
| 2 | අප්‍රේල් 4, බදාදා |
| 3 | මැයි 11, සිකුරාදා |
| 4 | ජූනි 29, සිකුරාදා |
| 5 | අගෝස්තු 3, සිකුරාදා |
| 6 | සැප්තැම්බර් 28, සිකුරාදා |
| 7 | නොවැම්බර් 14, බදාදා |
| 8 | දෙසැම්බර් 28, සිකුරාදා |

සාර්ථක නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් ශ්‍රී ලංකා මහ බැංකුවට තනිව ක්‍රියාත්මක කළ නොහැකිය. අප විසින් මීට පෙර අවධාරණය කළ පරිදි **රජයේ අඛණ්ඩ සහ දැඩි කැපවීම** ඒ සඳහා ඉතා වැදගත් වේ.

"2025 දැක්ම - පොහොසත් රටක්" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව, මහ බැංකුවේ අනාගත මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත යොමු වීම රජය විසින් දැනටමත් පිළිගෙන තිබීම අපව ධෛර්යවත් කරයි.

ඉහළ රාජ්‍ය මූල්‍ය විනයක් සහ ශක්තිමත් රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයක් සඳහා වන රජයේ අඛණ්ඩ සහ දැඩි කැපවීම නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සඳහා බලපාන ප්‍රධාන සාධක වේ. විශේෂයෙන්ම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් එකඟතාවයෙහි ද ඇතුළත් වන මැදි කාලීන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා වන රජයේ කැපවීම තවදුරටත් පවත්වා ගෙන යැමට අපේක්ෂිතය. අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය තුළින් ඇති වන වැඩිදියුණු වූ රාජ්‍ය මූල්‍ය අවකාශය, මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව සහ ස්වාධීනව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන හිතකර පරිසරය නිර්මාණය කරනු ඇත.

රජයේ මැදිකාලීන අයවැය රාමුව මගින් ප්‍රකාශයට පත් කළ පරිදි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා වැඩපිළිවෙළ අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා රජයේ කැපවීම මෙම සමස්ත ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වේ. ඒ අනුව,

දැනට පවතින ආදායම් බදු ව්‍යුහය සරල කිරීම සහ ක්‍රමානුකූල කිරීමේ අරමුණ ඇතිව බලාත්මක කළ නව ආදායම් බදු පනත, එකතු කළ අගය මත බදු ප්‍රතිසංස්කරණ සහ බදු පරිපාලන වැඩිදියුණු කිරීම වඩාත් සාධනීය වේ. තවද, රාජ්‍ය මූල්‍ය ඉලක්ක ස්ථාවරව පවත්වා ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත සංශෝධනය කිරීම තුළින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ශක්තිමත් කිරීමට ද රජය අපේක්ෂා කරයි. මෙමගින්, රටේ විදේශ ණය ප්‍රමාණය සහ ශ්‍රේණිගත කිරීමේ ආයතන වෙත නිරාවරණය වීම හා ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළවලට යොමු වීම සඳහා අත්‍යවශ්‍ය වන රාජ්‍ය මූල්‍ය විනය සඳහා වන රජයේ කැපවීම ආයතනිකගත කිරීම සිදු වේ.

තවද, මහ බැංකුවේ ස්වාධිපත්‍ය ආයතනිකගත කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ආධිපත්‍යයෙන් මුදල් ප්‍රතිපත්තිය ආරක්ෂා කර ගැනීම ඉතා වැදගත් වේ. ඒ අනුව, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය සඳහා යොමු වීමේ අංගයක් ලෙස මුදල් ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය පැහැදිලි ලෙස වෙන්ව පවත්වා ගෙන යෑම තහවුරු කිරීම සඳහා ශක්තිමත් නෛතික සහ ආයතනික බලතල ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සහතික කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව රාජ්‍ය මූල්‍ය හිඟයන් මූල්‍යනය කිරීමේ ක්‍රියාවලියෙන් ක්‍රමයෙන් බැහැර වීම අවශ්‍ය වේ. මෙමගින්, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කාර්යක්ෂමව සම්ප්‍රේෂණය සඳහා වැදගත් වන සංකීර්ණ සහ ද්‍රවශීල මූල්‍ය වෙළඳපොළක් ඇති කිරීමට ද මග සැලසේ.

රජය විසින් යෝජිත **වගකීම් කළමනාකරණ පනත** විචක්ෂණශීලී උපායමාර්ගයක් ලෙස අපි ද දකිමු. එමගින් රජයට රාජ්‍ය ණය වඩාත් නම්‍යශීලීව කළමනාකරණය කිරීමට ඉඩ සලසයි. මෙම රාමුව යටතේ, මුදල් නීති පනතේ වත්මන් විධිවිධාන අනුව සෑම වසරකම ආරම්භයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව මගින් රජය වෙත මූල්‍ය සහාය ලබාදීමේ අවශ්‍යතාව බැහැර කරමින්, රාජ්‍ය ණය ප්‍රමාණය තවදුරටත් එකතු වීමේ අවදානම අවම කිරීම සඳහා ආරක්ෂිත අරමුදලක් පිහිටුවීමට රාජ්‍ය ණය කළමනාකරුට අවස්ථාව සැලසේ. වගකීම් කළමනාකරණ පනත මගින් ඕනෑම වසරක දී රජයේ ණය ලබා ගැනීමේ අවශ්‍යතාවය ඉක්මවා ගොස් 2019 සිට ගෙවීමට නියමිත විදේශ ණය පියවීම් සඳහා අරමුදල් සම්පාදනය සඳහා අවකාශය ලැබීම ඉතා වැදගත්ය. රාජ්‍ය දේපළ බදු දීමෙන් ලැබෙන ආදායම් වගකීම් කළමනාකරණය සඳහා වෙන් කිරීමට රජය විසින් ගන්නා ලද තීරණය හිතකර ප්‍රවණතාවකි.

මේ අතර, **රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය** සඳහා රජයේ කැපවීම පැසසිය යුතු කරුණකි. විශේෂයෙන්ම, පිළිවෙළින්, 2018 මාර්තු සහ සැප්තැම්බර් මාසවලදී ඉන්ධන සහ විදුලිය සඳහා ස්වයංක්‍රීය මිල යාන්ත්‍රණ හඳුන්වා දීමට අපේක්ෂිතය. මෙමඟින් ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්ගේ අනාගත මූල්‍ය අලාභ අඩු කිරීමට සහ මිල ගණන් විශාල ලෙස වෙනස්වීම් අවම කිරීමට අවස්ථාව සැලසේ. මෙමගින් මුදල් ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට සහාය වීම පමණක් නොව රජයේ සහ රජයේ බැංකුවල ශේෂ පත්‍ර මත ද සාධනීය බලපෑමක් ඇති කරනු ඇත.

අපි සැවොම දන්නා පරිදි, ආර්ථිකයේ උද්ධමනය සහ උද්ධමන අපේක්ෂා මහ බැංකුවට පමණක් පාලනය කළ නොහැක. උද්ධමනයට බලපෑම් ඇති වන සැපයුම් අංශයේ සාධක සඳහා මහ බැංකුවට බලපෑම් ඇති කළ නොහැක. මුදල් ප්‍රතිපත්තිය තුළින් කාර්යක්ෂම ලෙස ඉල්ලුමෙන් ජනිත වන උද්ධමනය පාලනය කළ හැකි වුවද **උද්ධමනය මත සැපයුම් අංශයෙන් ඇති වන පීඩන කළමනාකරණය කිරීම** සඳහා රජයේ සහාය අත්‍යවශ්‍ය වේ. මේ සඳහා, සැපයුම් අංශයේ කම්පන අවම කිරීම තුළින් උද්ධමනය ස්ථාවරව පවත්වා ගැනීම සඳහා රජය අප්‍රමාදව කටයුතු කිරීම අවශ්‍ය වේ.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවෙහි ප්‍රධාන පූර්වෝපාංග සපුරාලීම සඳහා රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ඒකාබද්ධ උත්සාහය සහ කැපවීම තුළින් ඉදිරි වසර තුනක කාලය පුරා වැදගත් සන්ධිස්ථාන කිහිපයකට ළඟා විය යුතුව ඇත. 2020 වසරේ දී නිල වශයෙන් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව වෙත යොමු වීමට පෙර නෛතික සංශෝධන, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව පවත්වා ගෙන යෑම, මුදල් සහ රාජ්‍ය මූල්‍ය ක්‍රියාවලීන්හි අවශ්‍ය වෙනස්වීම් ආයතනීකරණය කිරීම සහ මේ පිළිබඳ මහජනතාවගේ ඇති දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම හා විශ්වාසය දිනා ගැනීමට නුදුරු අනාගතයේ දී ප්‍රමුඛතාව දී කටයුතු කළ යුතුව ඇත.

මේ සඳහා, පෙර සඳහන් කළ පරිදි, අවශ්‍ය ප්‍රතිසංස්කරණ සහ නව ක්‍රමෝපායයන් පෙන්වා දෙමින් **නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙතට යොමු වීම සඳහා පෙර දැක්මක්** අප විසින් සකසා ඇත. මෙය, ආයතනික, සංවිධාන සහ මෙහෙයුම් අංශවල වෙනස්කම්, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, විදේශ විනිමය ප්‍රතිපත්තිය සහ විදේශ විනිමය මෙහෙයුම් මෙන්ම ශක්‍යතා වර්ධනය අරමුණු කොට සැකසී ඇති අතර, මෙමගින් ආර්ථික ඉලක්ක වෙත විධිමත්ව ළඟා වීම සඳහා රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්තිය යන දෙඅංශයම නිසි පරිදි මෙහෙයවීම ද සිදු වේ.

අපගේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාකාරකම් සහ දිශානතීන් සැකසීමේ දී **විදේශ වාතාවරණය** පිළිබඳව ද නොසලකා සිටිය නොහැක. ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසු ගෝලීය ආර්ථිකය තුළ ප්‍රථම වරට ප්‍රධාන ආර්ථිකයන් අතර මුදල් ප්‍රතිපත්තිවල ඇතැම් වෙනස්වීම් දක්නට ලැබේ. මෙමගින් ප්‍රාග්ධන සහ මුදල් වෙළඳපොළවල දැඩි උච්චාවචන පැනනැගිය හැක. එබැවින්, අප සුපරීක්ෂාකාරීව සිටිය යුතුය. ඇමරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය වැනි දියුණු ආර්ථිකයන් මෙන්ම නැඟී එන ආර්ථිකයන් සිදු කළ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීම් මගින් ප්‍රාග්ධනය නැවත බෙදාහැරීම් හරහා ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑම් එල්ල විය හැකි බව අපි දනිමු. මේ අතර, ප්‍රධාන අපනයන ගමනාන්තවල ආර්ථික සහ දේශපාලනික වර්ධනයන් මෙන්ම ප්‍රධාන වෙළඳ භාණ්ඩ මිල ගණන්වල ප්‍රවණතා මගින් ද දේශීය ආර්ථිකයට සැලකිය යුතු බලපෑම් ඇති විය හැක.

# 3. 2018 වසර සහ ඉදිරිය සඳහා මූල්‍ය අංශ ප්‍රතිපත්ති

තිරසාර වර්ධනයක් සඳහා උපකාරී වන, නව ප්‍රවණතා සමඟ වෙනස් වන හා ශක්තිමත් මූල්‍ය අංශයක් ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව, තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මූලිකව ම මූල්‍ය ආයතන නියාමනය සහ අධීක්ෂණය, සවිමත් සහ ආරක්ෂිත ගෙවීම් සහ පියවීම් පද්ධතියක් සහතික කිරීම, අවදානම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම සහ මූල්‍ය අංශය තුළ යහපත් ආයතනික පාලන ප්‍රමිතීන් සහ පරිචයන් ඇති කිරීම සඳහා ක්‍රියා කරයි.

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ ප්‍රශස්ත පරිචයන්ට අනුකූල වෙමින්, මූල්‍ය පද්ධතියේ ස්ථාවරභාවය තහවුරු කිරීම සඳහා මහ බැංකුවේ විෂය පථය යටතට ගැනෙන මූල්‍ය ආයතන හා සම්බන්ධ නියාමන සහ අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව විසින් 2017 වසරේ දී ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ගණනාවක් හඳුන්වා දෙන ලදී. ඉහළ පිළිගැනීමක් සහිත සහ පළපුරුදු වෘත්තිකයන්, විශේෂඥයන් මෙන්ම මූල්‍ය අංශයෙහි ආයතනවල සහ නියාමන ආයතනනවල නියෝජිතයන්ගෙන් සමන්විත මූල්‍ය පද්ධති ස්ථායීතා උපදේශන කමිටුව අප විසින් 2017 වසරේ දී යළි ස්ථාපිත කරනු ලැබූ බව ද සඳහන් කළ යුතු තවත් වැදගත් කරුණකි. මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වාගෙන යෑම සඳහා වඩාත් යෝග්‍ය තීරණ නිශ්චය කිරීමට මෙම මූල්‍ය ස්ථායීතා උපදේශන කමිටුවේ අදහස් උපකාරී වේ.

රට තුළ මෙන්ම ඉන් පිටත පැනනැගිය හැකි අභියෝග සහ ආංශික පැතිකඩ තුළ සිදු වන වෙනස්වීම් ප්‍රමාණවත් ලෙස ග්‍රහණය කර ගත හැකි නීති මඟින් ඉදිරියේ දී සීඝ්‍රයෙන් වර්ධනය සහ වෙනස් වන අංශය ලෙස **බැංකු ක්ෂේත්‍රය** මෙහෙයවීම තහවුරු කිරීම සඳහා බැංකු පනත සංශෝධනය කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතී. මහ බැංකුව, බැංකු අංශයේ අදාළ සියලුම පාර්ශ්වකරුවන් හා ක්‍රියාශීලීව කටයුතු කරමින් නුදුරු අනාගතයේ දී නව බැංකු පනතක් කෙටුම්පත් කිරීමට බලාපොරොත්තු වේ.

බැංකු ක්ෂේත්‍රය සඳහා නියාමන සහ අධීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම අපගේ මූල්‍ය අංශ ප්‍රතිපත්ති අතර ප්‍රමුඛස්ථානයක් ගනී. එබැවින්, අපි අධීක්ෂණ කටයුතුවල දී අපගේ අවධානය අනුකූලතාව සම්බන්ධ නීතිය මත පමණක් මුළුමනින්ම පදනම් නොවී එක් එක් බැංකුවල සහ සමස්ත බැංකු පද්ධතියේ කාර්යක්ෂමතාව, ඵලදායීතාව සහ ස්ථාවරභාවය පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්වීම සහතික කිරීම සඳහා බැංකු අධීක්ෂණ ක්‍රමවේදය අඛණ්ඩව තවදුරටත් ඉහළ දැමීම සහ වැඩිදියුණු කිරීම සිදු කරන්නෙමු. ඒ අනුව, බැංකුවල කාර්යක්ෂමතා සහ තිරසාරභාවය තක්සේරු කරනු ලබන ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දර්ශකවල සංයෝජනයක් මත පදනම් ව බැංකු ශ්‍රේණිගත කිරීම සඳහා මූලික පියවර ගනිමින් සිටිමු. මෙම වසර අවසන් වන විට වාර්ෂික එතැන් පරීක්ෂණ ප්‍රවේශයේ සිට අවදානම මත පදනම් වූ අධීක්ෂණ

ප්‍රවේශයක් වෙත යොමු වීමට පහසුකම් සැලසීම සඳහා බැංකු තිරසාර අවදානම් දර්ශකය (Bank Sustainability Risk Index-BSRI) මත පදනම් වූ බැංකු පරීක්ෂණ ක්‍රමවේදය සකස් කර අවසන් කිරීමට අපි අපේක්ෂා කරමු. තව ද, එකිනෙකට වෙනස් වූ ක්‍රමවේද පදනම් කර ගනිමින් 2019 වසරේ සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම බලපත්‍රලාභී බැංකුවල පරීක්ෂණ වාර්තා සහ බැංකු සඳහා අධීක්ෂණ ශ්‍රේණිගත කිරීමක් සඳහා බැංකු තිරසාර අවදානම් දර්ශකය යොදා ගැනීමට අපි බලාපොරොත්තු වෙමු.

බාසල් III ප්‍රාග්ධන සම්මතයන් ක්‍රියාත්මක කිරීමෙහි ද බැංකු නිරත වී සිටින අතර 2019 වසරේ ජනවාරි පළමුවන දා වන විට එම සම්මතයන් ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ වීමට නියමිතයි. බැංකු සිය ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය වැඩිදියුණු කිරීමට කටයුතු කරන අතරම, සක්‍රීයව ප්‍රාග්ධන ස්වාරක්ෂක ගොඩනැංවීම තහවුරු කිරීම සඳහා ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකයක් සහ පද්ධතිමය වශයෙන් වැදගත්කමක් පවතින දේශීය බැංකු මත අධිභාරයක් පනවා ඇත. පවත්නා අවම ප්‍රාග්ධන අවශ්‍යතා වැඩි කිරීම සඳහා වන නීති, මෙම ස්වාරක්ෂක වඩා තිරසාර ස්වභාවයකින් තහවුරු කිරීම සඳහා ප්‍රාග්ධන ගුණාත්මකභාවය ඉහළ නැංවීම අරමුණු කරගෙන ඇත. අධික ණය වර්ධනය සහ / හෝ අහිතකර ආර්ථික තත්ත්ව සහිත කාලවල දී බැංකු ක්ෂේත්‍රය ආරක්ෂා කිරීමට මෙය උපකාරී වනු ඇත. එසේම, එය බැංකු අතර පවතින අන්තර් සම්බන්ධතාව තුළින් පැන නගින පද්ධතිමය අවදානම ද අවම කරනු ඇත.

බාසල් III මාර්ගෝපදේශ යටතේ, බැංකු තම වත්කම් සංයුතිය සහ ශේෂපත්‍රයෙන් බැහැර ගනුදෙනු පිළිබඳව ද සලකා බලමින් ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය (Net Stable Funding Ratio) හා සම්බන්ධ මාර්ගෝපදේශවලට අනුකූල වීම අවශ්‍ය වේ. මේ සම්බන්ධ උපදේශන පත්‍රිකාවක් දැනටමත් බැංකුවලට නිකුත් කර ඇති අතර, අදාළ සම්මුතීන් මෙම වසර තුළ දී ක්‍රියාත්මක කළ යුතුය. සරල, විනිවිදභාවයකින් යුත් සහ අවදානම් රහිත උපකරණයක් ලෙස තෝලන අනුපාතය (leverage ratio) හඳුන්වා දීමට නියමිත අතර, එය අනෙකුත් අවදානම් පාදක ප්‍රාග්ධන අවශ්‍යතාවයන් අතරට ඇතුළත් වනු ඇත. මෙම අනුපාතය හා සම්බන්ධ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම තුළින් බැංකු ක්ෂේත්‍රය තුළ අතිරික්ත තෝලනයක් ගොඩනැගීම පාලනය කිරීම අපේක්ෂා කෙරේ.

තැන්පතු රක්ෂණය සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන අතරම, ඵලදායී අර්බුද කළමනාකරණ සහ බේරුම් ක්‍රමවේදයක් පැවතීම, සාර්ථක අධීක්ෂණයක් සඳහා අවශ්‍ය පූර්ව කොන්දේසියකි. යෝග්‍ය ප්‍රතිසංවර්ධන සැලසුම් පවත්වා ගැනීම සමඟ බැංකුවලට මගපෙන්වීම සඳහා අපි අදාළ සියලු පාර්ශ්වකරුවන් සමඟ සමීපව කටයුතු කරමු. මූල්‍ය වත්කම් සුදුසු පරිදි වර්ගීකරණය කිරීම සහ මිනුම් කිරීම තහවුරු කිරීම සඳහා වසර තුළ දී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 9 (Sri Lanka Financial Reporting Standard 9) පිළිබඳව මූලික මාර්ගෝපදේශ නිකුත් කෙරෙනු ඇත. අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය තාර්කීකරණය කිරීම සඳහා මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු පිළිබඳව විධිවිධාන

දැනටමත් බැංකු වෙත නිකුත් කර ඇත. තව ද, දේශීය බැංකු ඒකකයේ වත්කම් මත පමණක් අදාළ වන පෙර පැවති විධිවිධාන වෙනුවට බැංකුවක මුළු වත්කම් මත පදනම් ව විදේශීය මුදලින් ණය ගැනීමේ සීමා පිළිබඳ නව විධිවිධාන නිකුත් කර ඇත.

බැංකු අංශය සඳහා නව සංවර්ධන කටයුතු කිහිපයක් සිදු කළ යුතුව පවතින අතර, අප විශ්වාස කරනුයේ සුදුසුකම් සහිත විගණකවරුන්ගේ මණ්ඩලයක් තෝරා ගැනීම සඳහා දැනට පවත්නා නිර්ණායක සහ යාන්ත්‍රණය නැවත සලකා බැලීම අත්‍යාවශ්‍ය වන බවයි. බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුවේ මාර්ගෝපදේශ මගින් ද මෙය අවධාරණය කර ඇත. බාසල් III ආකෘතියෙහි උද්ගත විය හැකි අවදානම් සහ ගැටලු සහ නුදුරේ දී බලාත්මක කිරීමට නියමිත නව ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ක්‍රියා කළ හැකි පරිදි වර්තමාන ඇගයුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සහ විගණකවරුන්ගේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා දැනට පවතින නිර්ණායක සහ තෝරා ගැනුම් ක්‍රියාවලිය දැඩි ලෙස සලකා බලමින් පවතී.

වැඩිදියුණු වන තාක්ෂණයන්හි අවදානම් කළමනාකරණය සඳහා පහසුකම් සැලසීම අරමුණු කර ගනිමින් සහ බැංකු මෙහෙයුම් තවදුරටත් ඩිජිටල්කරණය කිරීම දිරි ගැන්වීම සඳහා ක්ලවුඩ් පරිගණක තාක්ෂණය (cloud computing) භාවිතය පිළිබඳ නියාමන අපේක්ෂාවන් නිර්ණය කිරීම සහ අදාළ ෆින්ටෙක් (FinTech) මූල්‍ය තාක්ෂණය භාවිතය පිළිබඳව අවම නියාමන නිර්ණය කිරීම සඳහා ප්‍රතිපත්ති කිහිපයක් හඳුන්වා දෙනු ඇත. තවද, බැංකුවල තාක්ෂණික අවදානම්වලට ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීම සහ වර්ධනය කිරීම සඳහා තාක්ෂණික අවදානම ඇගයීමේ පුළුල් වැඩසටහනක් ද ක්‍රියාත්මක කෙරෙනු ඇත.

පසුගිය වසර පහ තුළ දී බැංකු අංශය වාර්ෂිකව ආසන්න වශයෙන් සියයට 15 කින් වර්ධනය වී ඇති අතර, **බැංකු නොවන මූල්‍ය ආයතන අංශය** ආසන්න වශයෙන් සියයට 20 කින් වර්ධනය වී ඇත. මෙම අංශය මූල්‍ය පද්ධතියේ සමස්ත වත්කම්වලින් සියයට 8 ක පමණ සාපේක්ෂ වශයෙන් කුඩා කොටසක් වුව ද, මෙම අංශයේ ශීඝ්‍ර වර්ධනය සහ පුළුල් ව්‍යාප්තිය, විචක්ෂණශීලී අධීක්ෂණය සහ නියාමන මාර්ගෝපදේශනයෙහි අවශ්‍යතාව අවධාරණය කරයි. මෙම ආයතන ශක්තිමත් කිරීම සඳහා නියාමනයන් රාශියක් හඳුන්වා දෙනු ලැබුව ද ඇතැම් බලපත්‍රලාභී මූල්‍ය සමාගම් එමගින් පීඩනයට ලක් වූ බවක් දක්නට ලැබුණු අතර, ඇතැම් බලපත්‍රලාභී මූල්‍ය සමාගම් නියාමන අවශ්‍යතා නිසි ලෙස සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම නිසා එම සමාගම්වල ශීඝ්‍ර ව්‍යාප්තිය සීමා විය. මෙමගින්, මෙම අංශයෙහි ශක්තිමත්භාවය තහවුරු කිරීම සහ එහි ක්‍රියාකාරකම් සමස්ත පද්ධතිය මත ඇති කරන බලපෑම පාලනය කිරීම සඳහා පවත්නා නියාමන ව්‍යුහය අඛණ්ඩව ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව නැවත නැවතත් අවධාරණය කෙරේ. උපායමාර්ගික ආයෝජකයන් හරහා එවැනි මූල්‍ය සමාගම් ඒකාබද්ධකරණය සහ ප්‍රතිප්‍රාග්ධනීකරණය කිරීම තුළින් පවතින දුර්වලතා සඳහා විසඳුම් ලබා දීමට දැනටමත් මූලික පියවර

ගෙන ඇත. මෙහිලා සඳහන් කළ යුතු වන තවත් කරුණක් වන්නේ  මෙම ආයතනවල මෙහෙයුම් කටයුතු සඳහා අදාළ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට අමතරව එහි ඉහළ කළමනාකරිත්වය ද එක හා සමානව වගකිව යුතු බවයි. තැන්පතුකරුවන්ගේ යහපත උදෙසා, අකටයුතුකම් සිදු කරන ලද වගකිවයුතු ඉහළ කළමනාකාරිත්වයට එරෙහිව අවශ්‍ය විටෙක නීතිමය විධිවිධාන ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව සලකා බලනු ඇත. 2017 වසර මැද භාගයේ දී අප විසින් 'නීතිය බලාත්මක කිරීමේ ඒකකයක්' (Enforcement Division) මහ බැංකුවේ නීති සහ අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව තුළ පිහිටුවන ලද අතර, එමගින් බලාත්මක කිරීම සහ මූල්‍ය ආයතනවලට අදාළ ගැටලු නිරාකරණය කිරීම, තහනම් මූල්‍ය යෝජනා ක්‍රම සහ නීත්‍යානුකූල නොවන තැන්පතු ලබා ගන්නා ඒකක ව්‍යාප්තිය වැළැක්වීම මෙන්ම විනිමය නීති උල්ලංඝනය කිරීම් පාලනය  කිරීම යනාදී කටයුතු සිදු කෙරේ. මෙම නීතිය බලාත්මක කිරීමේ ඒකකය 2018 වසරේ ජනවාරි 01 වන දින සිට සම්පූර්ණ දෙපාර්තමේන්තුවක් බවට පරිවර්තනය කර ඇත.

අපගේ නිරීක්ෂණ යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම සඳහා ද අපි පියවර ගෙන ඇත්තෙමු. පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතිය ද වැඩි දියුණු කර ඇත.  පසුගිය වසර තුළ දී මෙම පද්ධතිය සක්‍රීය හා කාලෝචිත මග පෙන්වීමක් ලබා දීමට උපකාරී වී ඇත. මීට අමතරව පවතින අභ්‍යන්තර යාන්ත්‍රණය ද නැවත සලකා බැලීමේ ක්‍රියාවලියකට ලක් කර ඇත.

2017 වසරේ ප්‍රතිපත්ති පෙර දැක්මෙහි ප්‍රකාශ කර ඇති පරිදි, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල සහ විශේෂිත කල්බදු  සමාගම්වල ප්‍රාග්ධන මට්ටම් තවදුරටත් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2018 වසරේ ජනවාරි 01 වන දින සිට එම ආයතන විසින් පවත්වාගත යුතු අවම මූලික ප්‍රාග්ධනය පෙර පැවති රුපියල් මිලියන 400 සිට රුපියල් බිලියන 1 දක්වා ද, ඉන් අනතුරුව 2019 වසරේ දී රුපියල් බිලියන 1.5 ක් දක්වා සහ 2020 වසරේ දී රුපියල් බිලියන 2.0 දක්වා ද ඉහළ නංවා ඇත. ප්‍රාග්ධන මට්ටම ශක්තිමත් කිරීම මගින් දැනට ක්‍රියාත්මක වන ආයතනවල ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවෙන අතර ම, මූල්‍යමය වශයෙන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සමාගම්වලට පමණක් ක්ෂේත්‍රය තුළ රැඳී සිටීමට දිරි ගැන්වෙයි. වෙළඳපොළ විසින් මෙහෙයවනු ලබන අත්පත් කර ගැනීම් හෝ ඒකාබද්ධකරණය තුළින්, ඉදිරියේ දී ක්ෂේත්‍රය තුළ මනා ඒකාග්‍රතා ක්‍රියාවලියක් පවත්වා ගැනීම සඳහා ද ශක්තිමත් ප්‍රාග්ධන ස්ථාවරත්වයක් පැවතීම අත්‍යවශ්‍ය වේ. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම්වලට තමන් විසින්ම ණය ශ්‍රේණිගත කිරීම් ලබා ගැනීම සඳහා සහ ඉන් අනතුරුව, කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීම සඳහා ඔවුන් දිරිගැන්වීමට දැනට සාකච්ඡා කෙරෙමින් පවතී. මෙමගින් අනෙක් අතට මූල්‍ය ස්ථායීතාව සහ මෙහෙයුම් විශිෂ්ටත්වය තහවුරු වන පරිදි යහපත් තරගකාරිත්වයක් ද නිර්මාණය කෙරෙනු ඇත. ණය හිමියන්ගේ අවදානම්, ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය සහ වෙළඳපොළ අවදානම මත පදනම් වන ණය අවදානම පිළිබඳව සැලකිලිමත් වන අතර ම, අවදානම කෙරෙහි සංවේදීතාව ඉහළ නැංවීමේ අරමුණින් බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍ය

සමාගම්වලට සියයට 12 ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයක් පවත්වා ගැනීමට අප විසින් උපදෙස් ලබා දීමට අදහස් කරන්නෙමු.

බැංකු නොවන මූල්‍ය අංශය තුළ අස්ථාවර සුළු පරිමාණ මූල්‍ය ව්‍යාපාර පැවතීම අවම කරමින් ස්ථාවර සහ ශක්තිමත් බැංකු නොවන මූල්‍ය ආයතන පවත්වාගෙන යෑම සඳහා බලපත්‍රලාභී මූල්‍ය සමාගම් හා විශේෂිත කල්බදු සමාගම් තුළ ඇති වන වෙනස්වීම් තුළින් මෙහෙයවනු ලබන අත්පත් කර ගැනීම් හා ඒකාබද්ධ කිරීම් දිරි ගැන්වෙනු ලැබේ.

බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ සිදුවන වෙනස්කම් සැලකිල්ලට ගනිමින් නියාමන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය ව්‍යාපාර පනත ද දැනට සංශෝධනය කෙරෙමින් පවතී. ඒ අනුව, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් හා නීත්‍යානුකූල නොවන ආයතන බේරුම් කිරීමට අදාළ විධිවිධාන ඇතුළත් වන පරිදි එම පනත සංශෝධනය කෙරෙමින් පවතී. මහජන මුදල් අයුතු ලෙස භාවිත කරන ලද පුද්ගලයින්ට විරුද්ධව නඩු පැවරීම කඩිනම් කරන අතර ම, වංචනික ක්‍රියා සඳහා නඩු පැවරීම සඳහා වන දියුණු කරන ලද යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි ද මෙහිදී අවධානය යොමු වනු ඇත. මෙයට සමගාමීව, පාරිභෝගික ආරක්ෂණය වැඩිදියුණු කිරීම හා ඒ ආශ්‍රිත අක්‍රමිකතා වැළැක්වීම සඳහා වන ප්‍රඥප්තියක් ද මෑතක දී නිකුත් කර ඇත.

විශේෂයෙන් ම, උතුරු හා උතුරු මැද පළාත්වල බැංකු නොවන මූල්‍ය ආයතන මගින් සිදු කරනු ලබන සදාචාර විරෝධී ණය දීම් සහ ජනතාව අතර ණයගැතිභාවය ඉහළ යෑම සම්බන්ධයෙන් පුළුල් අවධානයක් යොමු වෙමින් පවතියි. එබඳු ආයතන සහ රාජ්‍ය නියෝජිත ආයතන ද ඇතුළත් වෙනත් පොදු පාර්ශ්වකරුවන් සමඟ සක්‍රීයව සම්බන්ධ වෙමින් මහජනතාව දැනුම්වත් කරන අතරම, අදාළ ක්‍රියාකාරකම් සීමා කිරීමට සහ එබඳු ගැටලු නිසි ආකාරයෙන් පාලනය කිරීමට අපි සක්‍රීයව කටයුතු කරමු. මහජන දැනුම්වත්කිරීම් තුළින් සමාජයේ පවතින මෙවන් ගැටලුකාරී ගනුදෙනු නවතා ගත හැකි බව අප තරයේ විශ්වාස කරන අතර, නීත්‍යානුකූල නොවන ආයෝජන ක්‍රම හා බැඳුණු අවදානම පිළිබඳවත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තැන්පතු භාර ගැනීම සඳහා බලය පවරන ලද බලපත්‍රලාභී ආයතනවල මුදල් ආයෝජනයේ ප්‍රතිලාභ පිළිබඳවත් මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යෑමට අපි අදහස් කරමු. තව ද, නිරන්තරයෙන් ප්‍රාථමික වෙළඳුන්ගේ ගනුදෙනුවල අවදානම ඇගයීම සඳහා අධීක්ෂණ ක්‍රමවේදයක් ගොඩනැගීමට ද අපි අපේක්ෂා කරමු.

සමස්ත ආර්ථිකයේ වර්ධනයන් නිරතුරුවම අධීක්ෂණය කිරීම සහ රටෙහි සමස්ත මූල්‍ය පද්ධතිය මත එහි බලපෑම ඇගයීම සඳහා ක්‍රියාශීලී **සාර්ව විචක්ෂණතා අධ්‍යයනවල** ද අපි නිරතව සිටිමු. මෙම අධ්‍යයන ප්‍රයත්න තුළින් ඵලදායී නොවන අංශවලට අධික ලෙස ණය දීම, බැංකු නොවන මූල්‍ය අංශයේ සමස්ත වත්කම් වර්ධනය දිගින් දිගට ම මන්දගාමී වීම සහ ප්‍රාග්ධන ස්වාරක්ෂකයන්ගේ පහළ යෑම් හා දුර්වල

මූල්‍ය ආයතන පැවතීම වැනි ගැටලු ඉස්මතු වී ඇත. මේ අනුව, ඉදිරි වසර කිහිපය තුළ දී ද්‍රවශීලතා සහ පොලී අනුපාතික පරතරයන් හා විවිධ මුදල් වර්ගවලින් පවතින විදේශ විනිමය අවදානම විශ්ලේෂණය කිරීම, මූල්‍ය ආයතනවල තෝලන අධීක්ෂණය කිරීම සහ මූල්‍ය අංශයේ ණය අවදානම පිළිබඳ තක්සේරු කිරීම වැඩිදියුණු කිරීම තුළින් සාර්ව විචක්ෂණතා අධ්‍යයනයේ ආයතනික රාමුව අඛණ්ඩව ශක්තිමත් කිරීමට අපි කටයුතු කරන්නෙමු. සාර්ව විචක්ෂණතා අධ්‍යයනයේ කොටසක් ලෙස දේශීය මූල්‍ය පද්ධතියට සිදු වන පද්ධතිමය අවදානම හඳුනා ගැනීමට, පද්ධතිමය අවදානම් සමීක්ෂණයක් අර්ධ වාර්ෂිකව ක්‍රියාත්මක කෙරෙමින් පවතියි. සංකීර්ණ අධීක්ෂණ පද්ධතියේ කොටසක් ලෙස මූල්‍ය චක්‍ර සහ ව්‍යාපාර චක්‍ර හඳුනා ගැනීමට සහ විශ්ලේෂණය කිරීමට පහසුකම් සැලසීම සඳහා ක්‍රමවේදයක් සකස් කෙරෙනු ඇත. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා බහුවිචල්‍ය ආතති පරීක්ෂා (Multi–variate stress tests) නිර්මාණය කෙරෙනු ඇත. මෙයට අමතරව, ගෘහස්ත ණයගැතිභාවය සම්බන්ධ දීප ව්‍යාප්ත අධ්‍යයනයක් සිදු කිරීමට නියමිතය.

වසර පුරා ම, **ගෙවීම් සහ පියවීම් යටිතල පහසුකම්** ශක්තිමත් කිරීම සඳහා පමණක් නොව කාසි හා නෝට්ටු අඩුවෙන් භාවිත කරන තත්ත්වයකට සමාජය පරිවර්තනය කිරීමට පහසුකම් සැලසීම සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සක්‍රීයව මහ බැංකුව මැදිහත් වී ඇත. 2018 වසරේ දී, පොදු ප්‍රවාහන සහ සමාජ ප්‍රතිලාභ යෝජනා ක්‍රම වැනි දෑ සඳහා යොදා ගන්නා ආකාරයේ අඩු වියදම් ගෙවීම් කාඩ්පත් වර්ග හඳුන්වා දීම සඳහා පහසුකම් සැලසීම පිණිස, ජාතික කාඩ්පත් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම අපි අධීක්ෂණය කරන්නෙමු. මූල්‍ය තාක්ෂණයේ (FinTech) ව්‍යාප්තිය ඉහළ යැමත් සමඟ, එම කාඩ්පත් වර්ගවල අනුකූලතා අවශ්‍යතාවයන් සහ භාවිතයන් පිළිබඳ විග්‍රහ කරමින් නිසි නියාමන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සිදු වනු ඇත.

තවද, මෑත වසරවල දී දක්නට ලැබුණු පරිදි, **සයිබර් ආරක්ෂණ** ගැටලු අපගේ මූල්‍ය අංශයේ ස්ථායීතාවයට සහ විශ්වසනීයත්වයට තර්ජනයකි. මේ හා සම්බන්ධිතව, මේ වනවිටත් මහ බැංකුවේ ආරක්ෂාව සඳහා පමණක් නොව බැංකුවල සහ අනෙකුත් මූල්‍ය ආයතනවල ප්‍රධාන පද්ධති ආරක්ෂාව සඳහා ද දැඩි ආරක්ෂිත පියවර ගෙන ඇත. මෙහිදී, මහ බැංකුව අනාගතයේ දී භාවිත වන ගෙවීම් ක්‍රමවේද සඳහා වන ගෙවීම් අයදුම් මෘදුකාංග දත්ත ආරක්ෂණ ප්‍රමිතීන්ට (PADSS) අනුගත වීම ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරමින් සිටියි. හර/ණය කාඩ්පත්, අන්තර්ජාල බැංකුකරණ සහ ජංගම දුරකථන ආශ්‍රිත බැංකුකරණ කටයුතු මගින් සිදු කෙරෙන ගනුදෙනු සඳහා තත්කාලීන කෙටි පණිවිඩ හෝ විද්‍යුත් තැපැල් මගින් දැනුම්වත් කිරීම සිදු කිරීම අපි අනිවාර්යය කරන්නෙමු. විකුණුම්පොළ ගෙවීම් (Point of Sale) ගනුදෙනු, අන්තර්ජාල බැංකුකරණය මෙන්ම මංගත සහ ජංගම තුන්වන පාර්ශවික මුදල් හුවමාරු කිරීම් සඳහා ද ද්වි-සාධක සත්‍යාපනය (two factor authentication) හඳුන්වා දීමට කටයුතු කරනු ඇත. තව ද, ගෙවීම් හා පියවීම් පද්ධතියේ යටිතල පහසුකම් නවීකරණය සඳහා පහත ප්‍රතිපත්ති හඳුන්වා දෙන්නෙමු.

- සහභාගිත්ව ආයතනවල විශාල වටිනාකම්වලින් යුතු මුදල් හුවමාරු සඳහා පහසුකම් සැලසීමත්, ඒවා අධීක්ෂණය කිරීමටත් මහ බැංකුව විසින් නවීන තාක්ෂණයෙන් යුත් තත්කාලීන දළ පියවීම් පද්ධතියක් ස්ථාපනය කරමින් පවතියි.

- සමස්තයක් ලෙස, පාරිභෝගිකයින් සහ මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම හා ජංගම දුරකථන ආශ්‍රිත විද්‍යුත් මුදල් හුවමාරු පද්ධතිවල මනා ක්‍රියාකාරිත්වයක් පවත්වා ගෙන යෑම සඳහා මහ බැංකුව විසින් අඛණ්ඩව මෙම පද්ධති සඳහා එතැන් පරීක්ෂණ සහ දුරස්ථ පරීක්ෂණ පවත්වාගෙන යනු ඇත.

- විද්‍යුත් වාණිජ්‍ය (e-commerce) සහ අන්තර්ජාල ගෙවීම් සඳහා ආරක්ෂිත ක්‍රමවේදයක් තහවුරු කිරීම සඳහා, මහ බැංකුව නියාමකයා වශයෙන්, මහජනතාවගේ විශ්වාසය පවත්වා ගැනීම සඳහා විද්‍යුත් වාණිජ්‍ය සේවා සැපයුම්කරුවන් අධීක්ෂණය කිරීම සහ ප්‍රමිතීන් සහිත මාර්ගෝපදේශන ලබා දීම අඛණ්ඩව කර ගෙන යනු ඇත.

- චෙක්පත් භාවිතය වෙනුවට ඩිජිටල් ගෙවීම් යාන්ත්‍රණයක්/ක්‍රමවේදයක් වෙත මාරු වීම තුළින් ශ්‍රී ලංකාව තුළ චෙක්පත් භාවිතය අඩු කිරීම සඳහා ප්‍රතිපත්ති හඳුන්වා දෙනු ඇත. රජයේ සහ පුද්ගලික ආයතනවලට ඕනෑම ඉලෙක්ට්‍රොනික් ගෙවීම් පද්ධතියක් හරහා ගෙවීම් සිදු කිරීමට පහසුකම් සැලසීම සහ එවන් පියවීම් ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව කටයුතු කරනු ඇත.

- සියලු අංගයන්ගෙන් සමන්විත ඩිජිටල් පද්ධතියක් තුළ වර්තමානයේ පවතින සමස්ත මූල්‍ය ගනුදෙනු යටිතල පහසුකම් පද්ධතිය වෙනස් කිරීම සඳහා Blockchain තාක්ෂණය වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර, මූල්‍ය ආයතන හා සේවාවන් සඳහා බෙදා හැරෙන ලෙජර් පද්ධති ඒකාබද්ධ කිරීම සඳහා රටෙහි පවත්නා නීතිරීතිවලට අනුකූලව පහසුකම් සලසන්නෙමු.

- ගෝලීයව ඩිජිටල් මුදල් භාවිතය ජනප්‍රිය වීමත් සමඟ ව්‍යවහාර මුදල් ඩිජිටල්කරණය (Digital Fiat Currency) රටෙහි වත්මන් ආර්ථිකය වෙත සිදු කරන බලපෑම් හඳුනා ගැනීම සඳහා මහ බැංකුව අධ්‍යයනයක් සිදු කිරීමට අපේක්ෂා කරයි.

- පවත්නා සහ යෝජිත ගෙවීම් ක්‍රමවේද සම්බන්ධයෙන් මූලික මට්ටමේ සිට ආයතනික මට්ටම දක්වා අඛණ්ඩව දැනුම්වත් කිරීම් සඳහා පහළ සිට ඉහළ දක්වා ක්‍රියාත්මක වන්නා වූ ප්‍රවේශයක් භාවිත කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

- ගෙවීම් කාඩ් සහ ජංගම ගෙවීම්වල නව ප්‍රවණතාවන්ට පහසුකම් සැලසීම සඳහා ණය කාඩ්පත් හා සම්බන්ධ සංශෝධිත මාර්ගෝපදේශ සහ ජංගම ක්‍රමවේද සඳහා මෙහෙයුම් සිදු කරන, පහසුකම් සලසන හා ගෙවීම් සේවා සපයන ඕනෑම ආයතනයක් සඳහා අදාළ වන ජංගම ක්‍රමවේද සඳහා වන අවම අනුකූලතා ප්‍රමිතීන් පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

මූල්‍ය බුද්ධි වාතාවරණය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව, **මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම** සඳහා වන ප්‍රතිපත්ති සම්පාදනය කර මූල්‍ය කාර්යසාධක බලකායේ (Financial Action Task Force) නිර්දේශ වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පාර්ශ්ව සමඟ සම්බන්ධීකරණ කටයුතු අපි අඛණ්ඩව සිදු කරන්නෙමු. 2016 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත අන්තර්ජාතික නිර්දේශ මත පදනම්ව සංශෝධනය/අවලංගු කිරීමට පියවර ගන්නෙමු. සාපරාධි කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතා පනත (Mutual Assistance in Criminal Matters Act), රාජ්‍ය නොවන සංවිධාන පනත සහ භාරකාර ආඥා පනත සංශෝධනය සඳහා පහසුකම් සැලසීම හා අදාළ පාර්ශ්ව සමඟ සම්බන්ධීකරණ කටයුතු ද අපි සිදු කරන්නෙමු.

2014 වසරේ දී, ප්‍රධාන පාර්ශවකරුවන් නියෝජනය කරන වෘත්තීයවේදීන් 70කට අධික පිරිසකගේ සහයෝගය ඇතිව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සඳහා අවදානම් ඇගයීම (National Risk Assessment) මහ බැංකුව විසින් සංවිධානය කරන ලදී. 2018 වසරේ දී, මෙම ජාතික අවදානම් ඇගයීම් වාර්තාව යාවත්කාලීන කිරීමට අපි කටයුතු කරන්නෙමු. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධ දත්ත සඳහා තනි දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමට අදාළ පාර්ශ්වකරුවන්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (Information and Communication Technology Agency of Sri Lanka -ICTA) සමඟ ද අපි සම්බන්ධීකරණ කටයුතු සිදු කරන්නෙමු.

තවදුරටත්, සමූලඝාතක අවි ව්‍යාප්තිය සඳහා මුදල් සැපයීම (proliferation financing) හා සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති (UNSCR 1718 and UNSCR 2231) ක්‍රියාත්මක කිරීම සඳහා අපි විදේශ කටයුතු අමාත්‍යාංශය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන්නෙමු. තවද, අපගේ ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම සහ සහයෝගිතාව ශක්තිමත් කිරීම සඳහා එග්මන්ට් සමූහය (Egmont Group) ඇතුළු ජාත්‍යන්තර ප්‍රජාව සමඟ ද අපි සම්බන්ධීකරණ කටයුතු අඛණ්ඩව සිදු කරන්නෙමු.

2017 වසර තුළ දී මහ බැංකුව ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහා විධාන නිකුත් කිරීම සහ ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත මූලධර්ම, ප්‍රමිති සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම ආදී කටයුතු මගින් **ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ** නීතිමය රාමුව ශක්තිමත් කිරීමට අඛණ්ඩව කටයුතු කරන ලදී. ක්ෂුද්‍ර මූල්‍ය අංශය වඩාත් ඵලදායීව නියාමනය කිරීම සඳහා තැන්පතු භාර නොගන්නා ක්ෂුද්‍ර ණය දෙන ආයතන යෝග්‍ය නීතිමය රාමුවක් යටතේ නියාමනය කිරීම සහ ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුකරුවන් සඳහා ඒකාබද්ධ ගනුදෙනුකරුවන් සුරැකීමේ රාමුවක් සැකසීම ඇතුළුව ක්ෂුද්‍ර මූල්‍ය පනත නැවත සමාලෝචනය කිරීමේ ක්‍රියාදාමයක අපි නිරතව සිටින්නෙමු. ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ නියාමන සහ අධීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම සඳහා තවදුරටත් විධාන නිකුත් කිරීමට අපි සැලසුම් කර ඇත්තෙමු.

තවද, ක්ෂුද්‍ර මූල්‍ය පනතෙහි විෂය පථයෙන් බැහැර නියාමන ආයතන රාශියක් විසින් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය කරන බැවින් සාකල්‍ය පිළිවෙතක් යටතේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය නියාමනය අපහසු කර්තව්‍යයක් බව අපි විසින් හඳුනා ගෙන ඇත්තෙමු. එබැවින්, 2018 වසර තුළ දී සියලුම ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය කරන්නන්ගෙන් සමන්විත අන්තර් නියාමන කවුන්සිලයක් කැඳවීම සඳහා අපි කටයුතු කරන්නෙමු.

අනෙකුත් මූල්‍ය ආයතන නිසි පරිදි පවත්වාගෙන යෑමට අවශ්‍ය සෑම උත්සාහයක් ම ගන්නා අතර ම මහ බැංකුව ද නිසි ක්‍රමවේදයකින් යුතුව පවත්වාගෙන යෑම අවශ්‍ය වේ. මේ හා සමගාමීව, **ආයතනගත අවදානම් කළමනාකරණ රාමුවක්** (Enterprise-wide Risk Management Framework-ERM) ක්‍රියාවට නැංවීම සහ බැංකුවේ අනුකූලතාව ශක්තිමත් කිරීම අපගේ උපායමාර්ගික ප්‍රමුඛතාවක් ලෙස අප විසින් හඳුනා ගෙන තිබේ. මහ බැංකුකරණය තුළ අවදානම් කළමනාකරණය සඳහා වන නව ප්‍රවණතා හා සමගාමීව, ආයතනගත අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කිරීම සමස්තයක් වශයෙන් සලකා අවදානම් කළමනාකරණය කිරීමේ ප්‍රවේශය ('whole of business' approach) වෙනුවට තනි තනිව දෙපාර්තමේන්තු වශයෙන් අවදානම් කළමනාකරණ කිරීමේ ප්‍රවේශයක් ('silo based' approach) වෙත යොමු වීමට උපකාරී වේ. මහ බැංකුවේ අවදානම් කළමනාකරණය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය, සමාලෝචනය සහ අඛණ්ඩව වැඩිදියුණු කිරීම සඳහා පොදු පදනමක් සහ ආයතනික වැඩපිළිවෙලක් සහිත සියලු මට්ටම්, අංශ හා දෙපාර්තමේන්තුවල සියලු අවදානම් ඒකාබද්ධ කිරීම අධීක්ෂණය සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සැකසීමට ආයතනගත අවදානම් කළමනාකරණය තුළින් අවකාශ සැලසෙනු ඇත. මෙමගින්, ඉහළ කළමනාකරණයට වඩාත් තොරතුරු සහිතව සහ අවදානම් පිළිබඳ වඩා දැනුවත්ව තීරණ ගැනීමට හැකි වන අතර ම, අවදානම අවම කිරීමේ සංස්කෘතිය සවිමත් කිරීම අභ්‍යන්තර යහපාලනය වැඩිදියුණු කිරීම, අවදානම් කළමනාකරණ පිරිවැය ප්‍රශස්ත මට්ටමක පවත්වා

ගැනීම සහ ඵලදායී සම්පත් භාවිතය වර්ධනය කිරීම සඳහා හේතු වනු ඇත. මේ තුළින් ද පාර්ශ්වකරුවන්ගේ සහ අනෙකුත් ප්‍රජාවගේ විශ්වාසය වර්ධනය වනු ඇත.

තෙවැදෑරුම් ආරක්ෂිත ක්‍රමවේදයක් මත පදනම් වූ ("Three Lines of Defense" model) ආකෘතිය සමඟ නව අවදානම් යහපාලනය සහ අවදානම් කළමනාකරණ ව්‍යුහයන්හි ප්‍රධාන අංග ලෙස සමස්ත මහ බැංකුව සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් යෝග්‍ය ආකාරයකින් ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ. අන්තර්ජාතිකව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව අවදානම් පිළිබඳ ලේඛණ සැකසීම සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය සමඟ බද්ධ වූ සිද්ධි වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් (incident reporting mechanism) සැකසීම සඳහා ප්‍රමුඛතාව ලැබෙනු ඇත. මෙම ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම තුළින් අවදානම් පිළිබඳව දැනුම්වත් වීම සහ අනුකූලතා සංස්කෘතියක් මහ බැංකුව තුළ ඇති කිරීමට හැකි වනු ඇත. තව ද, ශ්‍රේණිගත කිරීම්වල අනුකූලතාවය හඳුනා ගැනෙන පද්ධතියක් සමඟ ගෝලීය වශයෙන් ස්ථාපිතව ඇති මිනුම්දඬු හා සමගාමී වන අනුකූලතා රාමුවක් හඳුන්වා දීමට ක්‍රියා කරනු ඇත.

# 4. ආර්ථිකය සවිමත් කිරීම සඳහා වූ පුළුල් ප්‍රතිපත්ති

අප මෙතෙක් සාකච්ඡා කරනු ලැබුවේ මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් හා සබැඳුණු අනාගත සැලසුම් හා ප්‍රතිපත්ති පිළිබඳවය. මෙම ප්‍රධාන කාර්යයන්ට අමතරව ඒ හා බැඳුණු අනුයාත කාර්යයන් හා රජය වෙනුවෙන් සිදු කරනු ලබන නියෝජිත කාර්යයන් කිහිපයක ද අපි නිරත වෙමු.

**ව්‍යවහාර මුදල් කළමනාකරණය**

ඔබ දන්නා පරිදි මහජනතාවගේ භාවිතය සඳහා අවශ්‍ය වන මුදල් සංසරණය පවත්වා ගැනීමට මහ බැංකුව සැමවිටම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. 2017 වසර තුළ දී ද අඛණ්ඩව මෙම කාර්යයෙහි අප නිරත වූ අතර ම, ව්‍යවහාර මුදල් හා සම්බන්ධ කටයුතු සහ ක්‍රියාවලීන් වැඩි දියුණු කිරීම සඳහා ද අපි හැකි සියලු ප්‍රයත්න දැරුවෙමු.

විශේෂයෙන්ම, අලුතෙන් මුද්‍රණය කරනු ලබන මුදල් නෝට්ටුවල තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් එහි වූ දෝෂ සම්පූර්ණයෙන් ඉවත් කිරීම සඳහා අපි නෝට්ටු වෙන් වෙන්ව පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් (Single Note Inspection system) හඳුන්වා දුන්නෙමු. තව ද, වඩා ආරක්ෂිත මුදල් නෝට්ටු බාධාවකින් තොරව වෙළඳපොළ වෙත ලැබීම තහවුරු කිරීම සඳහා තවත් අභ්‍යන්තර ක්‍රියාවලි කිහිපයක් ම වැඩි දියුණු කිරීමට සහ ඉහළ නැංවීමට කටයුතු කළෙමු.

ඉදිරියේදී, ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් කළමනාකරණ ප්‍රතිපත්තිය තුළ මූලික අවධානය යොමු කරනු ලබන කරුණක් වනුයේ ව්‍යවහාර මුදල්වල ප්‍රමිති තත්ත්වයන් පවත්වාගෙන යෑමයි. මෙම තත්ත්වය තුළ, **පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය** ක්‍රියාවට නැංවීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සහ පිරිසිදු මුදල් සංසරණය තුළින් විදේශිකයන් තුළ ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා සිතා මතා විකෘති කරන ලද, හානි කරන ලද හා වෙනස් කරන ලද මුදල් නෝට්ටු 2018 අප්‍රේල් පළමු දින සිට භාර නොගන්නා ලෙසට බලපත්‍රලාභී වාණිජ බැංකුවලට උපදෙස් දී ඇත.

තව ද, 2018 වසරේ දී නව කාසි මාලාවක් හඳුන්වා දීමට සැලසුම් කර ඇති අතර, කාසි ටංකනය සඳහා යොදා ගනු ලබන ලෝහය වෙනස් කිරීම මගින් පිරිවැය අඩුකර ගැනීමටත් කාසිවල කල්පැවැත්ම ඉහළ නංවා ගැනීමටත් අපේක්ෂා කෙරෙයි.

මැදි කාලීනව, ව්‍යවහාර මුදල් කළමනාකරණ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා අති නවීන මුදල් කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීමට අපි බලාපොරොත්තු වෙමු. තවද, කාසි සඳහා වූ ඉල්ලුම

සපුරාලීම සඳහා කාසි බෙදා හැරීම සහ ප්‍රතිසංසරණය ක්‍රමානුකූලව සිදු කිරීමට දිවයින පුරා නෝට්ටු වෙනුවෙන් කාසි හුවමාරු කෙරෙන/නිකුත් කෙරෙන යන්ත්‍ර පිහිටුවීමට සැලසුම් කර ඇත.

**රාජ්‍ය ණය කළමනාකරණය**

දේශීය සහ විදේශීය ණය අතර නිසි සංකලනයක් පවත්වා ගනිමින් රට තුළ දැනට පවතින දැවැන්ත රාජ්‍ය ණය සංචිතය කළමනාකරණය කිරීමේ අභියෝගය මධ්‍යයේ විචක්ෂණශීලීව රාජ්‍ය ණය කළමනාකරණය කිරීම සඳහා අපගේ ඉහළම ප්‍රමුඛතාව ලබා දෙන්නෙමු. සත්‍ය වශයෙන් ම, අනාගතයේ දී ඇති විය හැකි ඉතා අහිතකර විෂම ණය චක්‍රයෙන් මිදීම සඳහා විචක්ෂණශීලී ණය කළමනාකරණයක් තුළින් ණය තිරසාර මට්ටමක පවත්වා ගැනීම මහ බැංකුවේ පුළුල් උපාය මාර්ගික සැලසුමෙහි ප්‍රමුඛතාවක් බවට පත් කොට ඇත. ඔබ සියලු දෙනාම දන්නා පරිදි, රජය වෙනුවෙන් සම්පාදනය කෙරෙන ණයවල තිරසාර බව තහවුරු කරමින් රජයේ මූල්‍යන අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය ණය අඩු ම පිරිවැයකින් නිසි කලට ලබා ගැනීමේ අරමුණු පෙරදැරිව ණය එක්රැස් කිරීම, කළමනාකරණය කිරීම සහ ණය සේවාකරණය මහ බැංකුවේ වගකීමයි.

පසුගිය පෙරදැක්මෙහි ඉදිරිපත් කළ පරිදි, 2017 වසර තුළ දී ණය කළමනාකරණ කටයුතුවල විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක්ම ගනු ලැබුණි. රජයේ දේශීය ණය සම්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීමට 2017 වසරේ ජූලි මාසය තුළ දී භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම සඳහා නව දෙමුහුන් ප්‍රාථමික නිකුත් කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබුණි.

තව ද, අප විසින් රාජ්‍ය ණය සුරැකුම්පත් වෙළඳපොළෙහි විනිවිදභාවය හා පුරෝකථනය කිරීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා භාණ්ඩාගාර සුරැකුම්පත් නිකුත් කිරීමේ කාලසටහනක් මහ බැංකු වෙබ් අඩවිය තුළ ප්‍රකාශයට පත් කොට ඇත.

2018 වසර තුළ දී අප තවදුරටත් රාජ්‍ය ණය කළමනාකරණයෙහි සුරක්ෂිතභාවය, කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු අඛණ්ඩව සිදු කිරීමට බලාපොරොත්තු වෙමු. 2018 වසර මුලදී වගකීම් කළමනාකරණ පනත ක්‍රියාවට නැංවීමට යටත්ව, රාජ්‍ය ණය සංචිතයෙහි වූ අවදානම අඩු කිරීම සඳහා වගකීම් කළමනාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙමගින් අපට නොපියවා ඉතිරිව පවත්නා ණය සංචිතයෙහි කල්පිරීමේ ව්‍යූහය වෙනස් කිරීම තුළින් ප්‍රතිමූල්‍යනය සඳහා වූ අවදානම අවම කර ගැනීමට හැකි වනු ඇත. තව ද, මේ යටතේ, ණය සේවාකරණ කාලසීමා දීර්ඝ කර ගැනීමට පමණක් නොව ණය පිරිවැය අඩු කර ගැනීම සඳහා ද ණය නැවත මිලදී ගැනීම, හුවමාරු කිරීම හා කල් ඇතිව අරමුදල් සම්පාදනය කර ගැනීම වැනි ක්‍රියාකාරකම් සලකා බලනු ඇත.

රාජ්‍ය ණය ව්‍යුහය සුමට කරන අතරම විශ්වසනීය පොළී අනුපාත කාල ව්‍යුහයක් ස්ථාපිත කිරීම තුළින් දිගුකාලීන ඵලදා වක්‍රය ගොඩ නැංවීම සඳහා අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග අප විසින් මධ්‍ය කාලීනව ක්‍රියාත්මක කරනු ඇත. මෙම ක්‍රියාමාර්ග රාජ්‍ය ණය සම්බන්ධයෙන් වූ ගැටලු අවම කර ගැනීම සඳහා උපකාරී වනු ඇත. අපට, අතීතයේ දී ණය ආපසු ගෙවීම් පිළිබඳ පිරිසිදු හා නොකැළැල් වාර්තාවක් පැවතුණි. මෙම තත්ත්වය අඛණ්ඩව රැක ගෙන යා යුතු අතර, ඒ සඳහා අවශ්‍ය සෑම උත්සාහයක්ම අප විසින් දරනු ඇත.

දේශීය වෙළඳපොළ වෙතින් රාජ්‍ය ණය සම්පාදනය කර ගැනීමේ ක්‍රියාවලියෙහි විනිවිදභාවය හා කාර්යක්ෂමතාව තවදුරටත් ඉහළ නැංවීමට භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ඉදිරිපත් කරන ලද නව ප්‍රාථමික නිකුතු ක්‍රමය හා සමාන ක්‍රමයක් භාණ්ඩාගාර බිල්පත් සඳහා ද ඉදිරිපත් කිරීමට පියවර ගනු ඇත.

රාජ්‍ය සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ කටයුතු වැඩිදියුණු කිරීම පිණිස විද්‍යුත් වෙළඳ පහසුකම් හා මධ්‍යම ප්‍රතිපාර්ශ්ව නිෂ්කාශනාගාරයක්, ඊට අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ සමඟ ස්ථාපනය කිරීමට යෝජනා කරමු. මෙම වැඩපිළිවෙළ තුළින් විනිවිදභාවය වැඩිදියුණු කිරීම හා වෙළඳපොළ නියෝජිතයින් අතර අසමාන තොරතුරු පැවැතීමේ අවදානම ඉවත් කිරීම අරමුණු කොටගත් ද්විතීයික වෙළඳපොළ තුළ ණය සාධන පත්‍ර පිළිබඳ තොරතුරු බෙදාහැරීමේ ක්‍රමවේදයක් අප විසින් ස්ථාපනය කරනු ඇත.

මීට අමතරව, යූරෝ නිෂ්කාශන පහසුකම (Euroclearing) තුළින් විදේශ ආයෝජකයන්ගේ රාජ්‍ය ණය සුරැකුම්පත් පියවීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.

රජයට පැහැදිලි මධ්‍ය කාලීන සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ සැලැස්මක් ඇත. මෙම සංවර්ධන සැලැස්මට සහායවීමට රජය වෙනුවෙන් මහ බැංකුව තවදුරටත් අඩු පිරිවැයක් සහිත විදේශීය වාණිජමය මූලාශ්‍ර වෙතින් අවශ්‍ය සංවර්ධන අරමුදල් සම්පාදනය කිරීම සඳහා මැදි කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගයේ පුළුල් පරාමිතීන්ට අනුකූලව කටයුතු කරනු ඇත.

**සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය**

ඔබ දන්නා පරිදි, සේවක අර්ථසාධක අරමුදලේ (සේ. අ. අ.) සුරක්ෂිත භාරකාරු ලෙස, අරමුදලේ කළමනාකරණයට අදාළ බලතල හා වගකීම් සියල්ල ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. රටේ පවතින විශාලතම විශ්‍රාම අරමුදල වශයෙන්, සේ. අ. අ. පසුගිය වසරේදී මුළු වත්කම් ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 2.0ක අගය ඉක්මවා යමින් වැදගත් සන්ධිස්ථානයක් පසු කළ අතර, ගෙවී ගිය වසර පහ තුළදී එම අරමුදල වාර්ෂිකව සියයට 13කින් වර්ධනය වී ඇත.

සාමාජිකයන්ට ලබා දෙන සේවාවන්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම පිණිස මෙහෙයුම් කටයුතු තවදුරටත් කාර්යක්ෂම හා ක්‍රමවත් කිරීම සඳහා 2017 වසරේදී පියවර කිහිපයක්ම ගන්නා ලදී. මෙය සිදු කරනු ලැබුවේ සාමාජික දායක මුදල් රැස් කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම වේගවත් කිරීම, සාමාජික ගිණුම් තත්කාලීනව යාවත්කාලීන කිරීම සහ ප්‍රතිලාභ ගෙවීම වේගවත් කිරීම මගිනි. ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් දායක මුදල් සහ සාමාජික තොරතුරු සපයන සේවායෝජකයන්ට ලබා දෙන සේවාවන් කැපී පෙනෙන ලෙස වැඩිදියුණු කෙරුණු අතර ම, බලපත්‍රලාභී වාණිජ බැංකු කිහිපයක් සමඟ එක්ව අප විසින් දායක මුදල් බැර කරන ගනුදෙනුකරුවන්ට එම මුදල් මංගතව බැංකු මගින් එවීමට පහසුකම් සලසන ලදී. මීට අමතරව, අරමුදලේ කළමනාකරණය සඳහා වන පාලන ව්‍යුහය පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් අරමුදලේ ආයෝජනවල වගවීම හා විනිවිදභාවය ඉහළ නැංවීම පිණිස ස්වාධීන හා අභ්‍යන්තර අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවක් පිහිටුවීම වැනි ක්‍රියාමාර්ග කිහිපයක්ම ගන්නා ලදී. තවද, ඉහළම ජාත්‍යන්තර පරිචයන්ට අනුව  අභ්‍යන්තර කටයුතු වැඩිදියුණු කිරීමට ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව වෙතින් සහාය ලබා ගැනිණි. පසුගිය වසරවලදී මෙන් ම, ලාභදායී සහ  විචක්ෂණශීලී ආයෝජන ඔස්සේ සාමාජිකයන්ට ඔවුන්ගේ ගිණුම් ශේෂයන් මත ලබාගත හැකි ඉහළම ප්‍රතිලාභය අත්කර දීමට අපි තවදුරටත් කටයුතු කළෙමු.

2018 වසරේ දී, වගවීම, විනිවිදභාවය හා අරමුදල ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සමස්ත කාර්ය සාධනය තවදුරටත් වර්ධනය කිරීමට අපි පියවර ගන්නෙමු.  සේ. අ. අ.හි ක්‍රියාකාරකම් සඳහා වන සමස්ත අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම ද 2018 වසරේ ප්‍රමුඛතාවන් අතර ඉහළින් ම පවතී.  මෙම තත්ත්වය තුළ, ආයෝජන සහ අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් ඵලදායී ලෙස පවත්වා ගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වන පුහුණු හා සංවර්ධන කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීම තුළින් ආයතනික ශක්‍යතාව තව දුරටත් වැඩිදියුණු කිරීම සඳහා අපි සියලු ප්‍රයත්න දරන්නෙමු. ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබෙන තාක්ෂණික සහාය අපගේ ශක්‍යතා වැඩිදියුණු කිරීමේ ප්‍රයත්න සඳහා සැලකිය යුතු ලෙස දායක වනු ඇත.  මූලිකවම, අපගේ සාමාජිකයින්ට ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් ශේෂයන් සඳහා ඉහළම ප්‍රතිලාභය ලබා දීම පිණිස අපි සියලු විචක්ෂණශීලී පියවර ගන්නෙමු. මෙයට අමතරව, සේ. අ. අ. රජයේ ප්‍රතිපත්ති තීරණයට අනුව එම අරමුදල ආශ්‍රිත ගනුදෙනු සඳහා සුවිශේෂී හැඳුනුම් අංකය ලෙස නව ජෛවමිතික ජාතික හැඳුනුම්පත් අංකය භාවිත කිරීමට දැනටමත් කටයුතු කරමින් සිටී.  තත්කාලීනව ලේඛන ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය හා කාර්ය ප්‍රවාහ කළමනාකරණ පද්ධතිය හඳුන්වාදීම මගින් සේ. අ. අ. සඳහා බොහෝදුරට කඩදාසි භාවිත නොකෙරෙන මෙහෙයුම් පරිසරයක් හඳුන්වාදීමේ කර්තව්‍යය ඉටු කිරීමට අප පියවර ගෙන ඇත.

**විදේශ විනිමය කළමනාකරණය**

2017 වසර සඳහා වූ ප්‍රතිපත්ති පෙර දැක්ම මගින් ඉදිරිපත් කරන ලද යෝජනා සාර්ථකව ක්‍රියාවට නංවමින් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම උදෙසා නව විදේශ විනිමය කළමනාකරණ රාමුවක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, නව විදේශ විනිමය පනතෙහි සඳහන් ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සඳහා පෙර පැවති විනිමය පාලන දෙපාර්තමේන්තුව වෙනුවට විදේශ විනිමය දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. මීට අමතරව, 2017 වසර තුළ දී ප්‍රාග්ධන ගනුදෙනු තවදුරටත් ලිහිල් කිරීම සඳහා ද අප විසින් ප්‍රතිපත්ති කිහිපයක් ක්‍රියාවට නංවන ලදී. 2018 වසර සහ ඉදිරිය සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත විදේශ විනිමය ප්‍රතිපත්ති මගින් මූලික අවධානය යොමු කොට ඇත්තේ, ගෝලීය ව්‍යාපාර පරිසරය තුළ ශ්‍රී ලංකාවට තරගකාරී වාසි අත්කර දීම අරමුණු කරගත් රටෙහි වත්මන් සමස්ත ප්‍රතිපත්තිමය ස්ථාවරය සමඟ ඒකාබද්ධ වීම පහසු කිරීමත්ය.

කාර්යක්ෂම ලෙස අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමේ අරමුණ ඇතිව, බලයලත් විදේශ විනිමය වෙළඳුන් සහ සීමිත විදේශ විනිමය වෙළඳුන් සඳහා නව 'තත්කාලීන' වාර්තා කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ පද්ධතියක් හඳුන්වා දීමට නියමිත අතර, එමගින් විදේශ විනිමය ප්‍රවාහ හුවමාරු රටාවන් හඳුනා ගනිමින් සාර්ව-ආර්ථික තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම අරමුණු කෙරේ. වෙළඳපොළ විනය වැඩිදියුණු කිරීමේ දී ඊට අනුකූල නොවන සිදුවීම් හඳුනා ගැනීමේ සහ එවන් සිදුවීම් අවම කිරීමේ අරමුණු පෙරදැරිව, වාර්තා කිරීමේ ක්‍රියාවලියේ අංගයක් වශයෙන් දුරස්ථ අවේක්ෂණ කටයුතු (offsite surveillance) ශක්තිමත් කිරීමට කටයුතු කෙරෙනු ඇත.

**ප්‍රාදේශීය සංවර්ධනය**

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සහ කෘෂිකර්මාන්තය හා පශු සම්පත් සංවර්ධන කිරීම, මූල්‍ය අන්තර්ගතභාවය වැඩි දියුණු කිරීම සහ රටේ සමබර ප්‍රාදේශීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ප්‍රතිමූල්‍ය පහසුකම්, පොලී සහනාධාර සහ /හෝ ණය සුරැකුම් මෙන් ම ණය සමඟ අතිරේක පහසුකම් සැපයීම සඳහා විවිධාකාර සහනදායී සංවර්ධන ණය යෝජනා ක්‍රම රාශියක් සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව තවදුරටත් කටයුතු කරයි. ඵලදායී ණය සැපයුම ශක්තිමත් කිරීම හා විධිමත් මූල්‍ය ක්ෂේත්‍රය පුළුල් කිරීම සඳහා 2017 වසරේ දී ණය යෝජනා ක්‍රම කිහිපයක්ම හඳුන්වා දෙන ලදි.

තවද, සමාජයේ අඩු පහසුකම්ලාභී අංශවලට විධිමත් මූල්‍ය අංශය වෙත එක්වීමට අවශ්‍ය පරිසරයක් නිර්මාණය කිරීම මෙන්ම තිරසාර සංවර්ධනයක් ඇති කිරීම පිණිස, ණය සැපයුම පුළුල් කිරීම, ණය සමඟ වෙනත් පහසුකම් සැපයීම සහ මූල්‍ය නොවන අනුග්‍රහයන් සැපයීම මගින් මහ බැංකුව රටේ සියලුම

අංශවලට පහසුකම් සලසයි. රටේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපාය මාර්ගයක් සැකසීම සඳහා ද ප්‍රමුඛත්වයක් ලබා දී ඇත.

මෙයට අමතරව, ණය අයැදුම්පත් ලියාපදිංචිය සහ සහභාගීත්ව මූල්‍ය ආයතනවල ප්‍රතිමූල්‍ය අයැදුම්පත් සලකා බැලීම පිළිබඳ කටයුතු ස්වයංක්‍රීය කිරීමට සහ ණය බෙදා හැරීමේ යාන්ත්‍රණය කාර්යක්ෂම කිරීම ඔස්සේ ආර්ථිකයේ අඩු පහසුකම්ලාභී කොටස් වෙත ලැබෙන ණය සැපයුම වේගවත්වත් කිරීමට අපි සැලසුම් කරන්නෙමු.

ඉදිරියේ දී, වැඩිදියුණු කරන ලද ණය ලබා දීමේ යාන්ත්‍රණය සහ මූල්‍ය නොවන අනුග්‍රහ ද මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන ප්‍රයත්නයන් සැලකිය යුතු ලෙස ඉහළ නංවා ගැනීමට දායක වනු ඇත. මෙම ප්‍රයත්න රජයේ ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ද උපකාරී වනු ඇත.

# 5. සමාප්ති සටහන

නෝනාවරුනි, මහත්වරුනි,

ප්‍රතිපත්ති පෙර දැක්මේ සංක්ෂිප්ත සාරාංශයක් සමඟ මෙම ප්‍රකාශය අවසන් කිරීමටයි මාගේ සූදානම.

2017 වසර ආරම්භයේ දී අපේ රට අභියෝග සහ අවිනිශ්චිතතා කිහිපයකටම මුහුණ දුන් නමුත් මහ බැංකුව සහ රජය විසින් ස්ථායීතාව ඇති කිරීමේ අරමුණෙන් ගනු ලැබූ විචක්ෂණශීලී ප්‍රතිපත්තිවල හිතකර බලපෑම හේතුවෙන් සමස්තයක් වශයෙන් අප ආර්ථිකය ස්ථායීතාවයක් කරා අඛණ්ඩව යොමු වෙමින් පවතියි. නමුත් අපට මෙතෙක් ළඟා කර ගත් ජයග්‍රහණවලින් සෑහීමට පත්විය නොහැකි අතර, අභියෝග කිහිපයක් රටේ සමස්ත සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය කෙරෙහි තවදුරටත් අහිතකර බලපෑම් ඇති කරන බව අපි දනිමු. ඒ නිසා, ආර්ථික ස්ථායීතාව ස්ථාවර පදනමක් මත ප්‍රතිස්ථාපනය කිරීමට, අප රටවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවිය හැකි වාතාවරණයක් ඇති කිරීමට අප විසින් කැප වීමෙන් කටයුතු කළ යුතුව ඇති අතර, ප්‍රතිපත්ති පෙර දැක්ම තුළින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති අපට එම වෑයම සඳහා උපකාරී වනු ඇති බව විශ්වාස කරමු.

එසේම, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් අවධාරණය කෙරෙන ආකාරයට පොහොසත් රටක් බවට අප පත් වන්නට නම් අපට රටේ වර්ධන ශක්‍යතාව ඉහළ නැංවීම සඳහා පුළුල් පදනමක් මත සිදු කෙරෙන ආර්ථික ප්‍රතිසංස්කරණ සහ ඉහළ කැපවීමක් අවශ්‍යයි. සාර්ව ආර්ථික ස්ථායීතාව ඇති කිරීමේ නියෝජිතයා වශයෙන් උද්ධමනය අඩු සහ ස්ථාවර මට්ටමක පවත්වා ගනිමින් සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව තහවුරු කරමින් ආර්ථික වර්ධනය ඉහළ නැංවීම සඳහා මහ බැංකුව සෑම විටම රජය සමඟ සමීපව, කැපවීමෙන් කටයුතු කරනු ඇත.

ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇති අපගේ අනාගත ප්‍රතිපත්ති දිශානතීන් සහ ක්‍රියාමාර්ග ඔබගේ අනාගත තීරණ සඳහා ඔබට මග පෙන්වීමක් කරනු ඇතැයි ද, ඔබගේ කටයුතු ආර්ථිකයේ පුළුල් ප්‍රතිපත්ති හා සමගාමී වනු ඇතැයි ද, අපි විශ්වාස කරමු. එසේම, වෙනස් වන සාර්ව ආර්ථික තත්ත්වයන් සහ වෙළඳපොළ වෙනස්වීම් හමුවේ අවශ්‍ය විටෙක නව ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග හඳුන්වා දීමට අප සූදානම් බව ද සඳහන් කිරීමට කැමැත්තෙමු. ඉහළ අවදානම් සහ අවිනිශ්චිතතාවන්ගෙන් ගහණ මෙන්ම, සීඝ්‍රයෙන් වෙනස් වන ලොවකට මෙම නම්‍යශීලීභාවය අත්‍යවශ්‍යයි.

එසේම, රජය සිය රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ගයන් තවදුරටත් ක්‍රියාත්මක කරනු ඇතැයි අපි දැඩි ලෙස විශ්වාස කරමු. එය අපට සාර්ව ආර්ථික ස්ථායීතාව ඇති කිරීමෙහිලා අපගේ ප්‍රතිපත්ති මෙහෙය වීම සඳහා උපකාරී වනු ඇත. එය විශේෂයෙන් ම, සැලසුම් කර ඇති පරිදි මුදල් ප්‍රතිපත්ති රාමුව වශයෙන් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය වෙත සාර්ථකව යොමු වීම සඳහා අවශ්‍ය කොන්දේසියකි.

මාගේ කථාව අවසන් කිරීමට පෙර, මහ බැංකුවේ කාර්යයන් කාර්යක්ෂමව කර ගෙන යාමේ අපගේ උත්සාහයන්ට අඛණ්ඩව දායක වන සහ සහයෝගය දක්වන පුද්ගලයන් වෙත මාගේ කෘතඥතාවය පළ කරන්නට කැමතියි.

පළමුවෙන්ම, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ට සහ ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමන්ට ඔවුන්ගේ මග පෙන්වීම සහ නායකත්වය වෙනුවෙන් මාගේ කෘතඥතාවය පළ කිරීමට කැමතියි. එසේම, අප වෙත ලබා දෙන සහයෝගය, විශේෂයෙන්ම, මුදල් අමාත්‍යාංශය සහ මහ බැංකුව අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම සඳහා දරන උත්සාහය වෙනුවෙන් ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර මැතිතුමන්ට ද මාගේ ස්තුතිය පිරිනැමීමට කැමතියි.

මුදල් මණ්ඩලයේ සාමාජිකයන්ගේ අමිල සහයෝගය සහ විචක්ෂණශීලී උපදෙස් ද මම ඉතා අගය කොට සලකන බව ප්‍රකාශ කිරීමට කැමතියි. මුදල් මණ්ඩලයේ දී අඛණ්ඩව සිදු කරන මැදිහත්වීම් සහ දායකත්වය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතාට, මනෝහාරී රාමනාදන් මහත්මියට, ක්‍රිෂාන්ත පෙරේරා මහතාට සහ නිහාල් ෆොන්සේකා මහතාට මාගේ කෘතඥතාවය පිරිනැමීමට කැමතියි. එසේම, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති, ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතාට සහ නියෝජ්‍ය අධිපතිවරුන් වන කේ. ඩී. රණසිංහ සහ සී.ජේ.පී. සිරිවර්ධන මහත්වරුන්ට ද ඔවුන් විසින් ලබා දෙනු ලබන සුවිශාල සහයෝගය හා ඉහළ වෘත්තීමය උපදෙස් සහ නිර්දේශ වෙනුවෙන් මාගේ කෘතවේදීත්වය පළ කිරීමට කැමතියි. එසේම, 2017 වසරේ දී මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගත් නියෝජ්‍ය අධිපතිවරුන් වන පී. සමරසිරි සහ එස්. ලංකාතිලක මහත්වරුන් විසින් ලබා දුන් මහඟු සේවය ද අගය කිරීමට මම කැමතියි.

අවසාන වශයෙන්, සහකාර අධිපතිවරුන්ටත් ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ටත්, මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීම සඳහා දරන ලද උත්සාහය වෙනුවෙන් විශේෂයෙන් ම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමිය සහ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය පළ කිරීමට කැමතියි. එදිනෙදා රාජකාරි කටයුතුවල දී මා හා කටයුතු කරන අධිපති කාර්යාලයේ කාර්යය මණ්ඩලයට මාගේ විශේෂ ස්තුතියක් පිරිනැමීමට කැමතියි. මහ බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කරන සහ වෘත්තීමයභාවයත්, තාක්ෂණික නිපුණත්වයත් අවංකභාවයත් පවත්වා ගනිමින් රටේ යහපත වෙනුවෙන් කටයුතු කරන මහ බැංකුවේ සියලුම කාර්ය මණ්ඩලය වෙත මාගේ ස්තුතිය පිරිනැමීමට කැමතියි. කෙසේ වුව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉතා සුළු පිරිසක් මෙම සුවිශේෂී ආයතනය අපේක්ෂා කරනු ලබන උසස් වෘත්තීය මට්ටමෙහි පිහිටා කටයුතු කර නොමැති බව හෙළි වී ඇත. එවන් තත්ත්වයක දී එවැනි අක්‍රමිකතා අනාගතයේ දී තවදුරටත් සිදු වීම වැළැක්වීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

ස්තුතියි. 2018 වසර ඔබ සැමට සුභ සහ සෞභාග්‍යමත් වසරක් වේවා!